
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්　　www.budusarana.lk　　email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ නිකිණි අව අටවක පෝ දා, 2021 අගෝස්තු 30 සඳුදා BUDUSARANA MONDAY AUGUST 30, 2021

56 කාණ්ඩය, 10 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.　　පිටු 12

# පරාර්ථය වෙනුවෙන් කැප වූ සංඝ පීතෘවරයාණන් වහන්සේ
# මතු බුදුවන අනඳ මෙත් මහ නාහිමි

**වයස අවුරුදු සියය ඉක්මවා තිබියදීත් එතෙර ධර්ම ප්‍රචාරය පිණිස වැඩම කළ බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නා හිමියන්ගේ 125 වන ජන්ම දිනය යෙදුණේ පසුගිය 23 වැනිදාට ය. උන් වහන්සේගේ අපරිමිත ගුණ සමුදාය වෙනුවෙන් තබන කෙටි සටහනකි මේ.**

කලින් කලට මෙරට පහළ වන යතිවරයාණන් වහන්සේ වෙති. එසේ බිහිවූ ශ්‍රේෂ්ඨ යතිවරුන්ගෙන් රටට, ජාතියට හා බුද්ධ ශාසනයටත් සිදුව ඇති සේවය අතිවිශාල ය. එවන් එක් යතිවරයාණන් වහන්සේ නමක් ලෙස බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමිපාණන් වහන්සේ පෙන්වා දිය හැකිය.

උන් වහන්සේ උපත ලබන්නේ 1896 වසරේ අගොස්තු 23 වැනිදා ය.

ලංකාවාසී බෞද්ධ ජනතාව විසින් උන්වහන්සේ හැඳින්වූයේ මතු බුදුවන හිමිනමක් ලෙසිනි.

බුද්ධ ධර්මය පිළිබඳ මනා දැනුමකින් එය ඉගැන්වීමට හැකියාවක් උන් වහන්සේ සතු විය. උන්වහන්සේගේ විෂයය වූයේ බුද්ධ වචනය කියා දීම පමණක් නොවේ. එය විශ්ලේෂණය කොට යුරෝපීය ජාතීන්ට කියාදීමට උන්වහන්සේට තිබූ හැකියාව මා සියැසින් ම දුටු අතර ඒ සඳහා පිරිස ආකර්ෂණය වන ආකාරය ද මම අවබෝධ කර ගත්තෙමි.

උන්වහන්සේ ලෝක ප්‍රකට උගතකු, බුද්ධිමතකු හා දාර්ශනිකයකු වශයෙන් ප්‍රසිද්ධියට පත්වූ නිසා ලොව බොහෝ රටවල උන්වහන්සේට ආරාධනා කළේ ධර්මය ඉගැන්වීමට මෙන්ම භාවනාව පුහුණු කිරීමට ය. උන්වහන්සේ එම ආරාධනයන් පිළිගෙන යුරෝපයේ හා අමෙරිකාවේ ධර්මය ඉගැන්වීම සඳහා අවුරුදු ගණන් කල් ගත කළ ආකාරය ද මම සියැසින් ම දුටුවෙමි.

බළන්ගොඩ නා හිමියන් මට අඳුනා ගන්නට ලැබෙන්නේ 1982 වසරේ ප්‍රංශයේදී ය. එය මා ලද ලොකුම භාග්‍යයක් ලෙස මා සලකන්නේ, කිසිදිනකවත් නොලබන්නට පුළුවන් අත්දැකීම් රාශියක් උන්වහන්සේගේ ඇසුරෙන් ලබා ගැනීමට හැකිවීම නිසා ය.

බෞද්ධාගම පිළිබඳව බොහෝ දැනුමක් ලබා ගත් එම පිරිස් බළන්ගොඩ මහා නාහිමියන්ගේ දේශනාවලින් බුදුදහම පිළිබඳ මනා අවබෝධයක් ලබමින් උන්වහන්සේට ගරු සත්කාර සම්මාන දක්වමින් තම ගැටලු නිරාකරණය කරගන්නට උත්සාහ දරන ආකාරය ද සිත් ගන්නා සුළු විය.


බළන්ගොඩ නාහිමියන් එංගලන්තයේ අමරාවතී බෞද්ධ විහාරයේ වසර ගණනක් වැඩවසමින් ධර්මය දේශනා කළ අතර ඉංග්‍රීසි ජාතික භික්ෂූන්ට හා අනෙකුත් රටවල යුරෝපීය භික්ෂූන්ටත් උපාසක උපාසිකාවන්ටත් පාලි භාෂාව ඉගැන්වීමේ නිරත වෙමින් සිටි කාලයේදී, 1982 වසරේ ප්‍රංශයට වැඩම කරවීම අප අද සිදුකරන ධර්මය ඉගැන්වීමේ කටයුතුවලට මහත් උපකාරයක් විය.

උන්වහන්සේලවා ධර්ම දේශනා කිහිපයක් ප්‍රංශයේ වාසය කරන බුද්ධාගම ගැන උනන්දුවක් දක්වන අය වෙනුවෙන් පැවැත්වීමට මා කටයුතු කළ අතර උන් වහන්සේගේ දේශනා පටිගත කොට බෙදා හැරීමටත්, උන්වහන්සේ ආනාපාන සතිය ගැන අපට කියා දුන් කුඩා පොතක් මුද්‍රණය කර නොමිලේ බෙදා හැරීමටත් මම කටයුතු කළෙමි. එදා අප මුද්‍රණය කළ පොත්පත් අදත් ප්‍රංශ මෙන්ම අනෙකුත් ජාතීන් අතර ඉතා ජනප්‍රිය ලෙස පවතී.

> ‘ මුළු රාත්‍රිය මුළුල්ලේ ම කිසිදු ලියවිල්ලක් භාවිත නොකරමින් උන්වහන්සේ ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය තුළ වැඩ සිටි භික්ෂූන් වහන්සේලාට අභිධර්මය ඉගැන්වීමට කටයුතු කළහ. මසක් පමණ උන්වහන්සේ අපට ලබා දුන් දහම් දැනුම අදත් අපට ඉතාම වටිනා මතක සටහන්ය. ’

උන්වහන්සේගේ ධර්මදූත සේවය ගැන ලිවිය යුතු කාරණා ඉතාම සංකීර්ණ ය. කිසිවකු නොකරන ලද කැපකිරීම් ධර්මය ඉගැන්වීමේ දී, සිල්වත් ගුණවත් සුපේසල ශික්ෂාකාමී යතිවරයාණන් වහන්සේ නමක් ලෙස උන්වහන්සේගෙන් සිදුවී ඇත.

ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය විවෘත කරන අවස්ථාවට සහභාගි වෙමින් එදා 1989 වසරේ සැප්තැම්බර් 17 වන දින එම විරල අවස්ථාව ආලෝකවත් කිරීමට බළන්ගොඩ මහ නාහිමියන්ගෙන් ලැබුණු පන්නරය අදත් අප ආයතනය තුළ විද්‍යමාන ය. අපගේ ආරාධනයෙන් වස් තුන් මසක් ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ වැඩ වසමින් උන්වහන්සේ සිදු කළ සේවාව, කාම්බෝජ, වියට්නාම, චීන සහ ශ්‍රී ලාංකික පිරිසට මෙන්ම ධර්මය සොයාගෙන එන ප්‍රංශ ජාතිකයන්ට ද මහත් අස්වැසිල්ලක් විය.



20 වන සියවසේ ලංකාවේ පහළ වූ මේ ශ්‍රේෂ්ඨතම සංඝ පීතෘවරයාණන් වහන්සේ පිළිබඳ ලියවී ඇති අප්‍රමාණ පොත් සංඛ්‍යාව තුළින් උන්වහන්සේගේ ජීවිතය පරාර්ථය වෙනුවෙන් මෙන්ම බුද්ධ ශාසනය වෙනුවෙන් ද කැප වී තිබූ ආකාරය මොනවට පසක් වනු ඇත.

මුළු රාත්‍රිය මුළුල්ලේ ම කිසිදු ලියවිල්ලක් භාවිත නොකරමින් උන්වහන්සේ ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය තුළ වැඩ සිටි භික්ෂූන් වහන්සේලාට අභිධර්මය ඉගැන්වීමට කටයුතු කළහ. මසක් පමණ උන්වහන්සේ අපට ලබා දුන් දහම් දැනුම අදත් අපට ඉතාම වටිනා මතක සටහන්ය. උන්වහන්සේ තෙමසක් තුළ අප ආයතනයේ වැඩවෙසෙමින් කරන ලද දේශනා සියල්ල සම්පිණ්ඩනය කොට සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ද එළි දැක්වීමට අප කටයුතු කළේ "බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමිපාණන් ප්‍රංශයේදී පැවැත්වූ විචිත්‍ර දේශනා" යනුවෙනි.

ලොව විවිධ රටවල සංචාරය කිරීමෙන් උන්වහන්සේ ලද අත්දැකීම් අප සමඟ පැවසූ සේක. විශේෂයෙන් ම ඉන්දියාවේ සංචාරයේ දී උන්වහන්සේ ලද අත්දැකීම් බොහොමයක් ම ඉතාමත් සිත්ගන්නා සුළු ඒවා විය. චිත්ත ශක්තිය උපයෝගී කර ගනිමින් උන්වහන්සේ සිදුකරන ලද විශ්මය දනවන දේ අප සමඟ පැවසූහ. ඒවා උන්වහන්සේ පිළිබඳ රචිත පොත්පත් තුළින්ද අපට දැකගන්නට පුළුවන.

උන්වහන්සේ මුළු ජීවිතයම කැප කළේ ධර්මය ඉගැන්වීමටය. අවසාන කාලයේදී වසර සියක් සම්පූර්ණ වී තිබියදීත් ධර්ම දේශනා සඳහා ආසියාතික රටවලින් උන්වහන්සේට ලැබෙන ආරාධනා සතුටින් භාරගෙන කටයුතු කළේ ධර්මය වෙනුවෙන් ජීවිතයේ අවසාන මොහොත දක්වාම කැප කළ යුතු ය යන අධිෂ්ඨානයෙනි.

වසර 101 කට වැඩි කාලයක් රටටත් ජාතියටත් බුද්ධ ශාසනයටත් මහත් සේවාවක් සිදු කළ ලෝක ප්‍රකට ධර්මදූතයන්වහන්සේ නමක් ලෙස විරුදාවලිය ලත් අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහා නාහිමිපාණන් වහන්සේ දැයෙන් සමුගත්තත් උන්වහන්සේ සිදු කළ සේවාව අදත් ලොව පුරා බුදුදහම අගය කරන පිරිසගේ මතකයෙන් අයින් වී නොමැත.

ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ වාර්ෂික ව උන්වහන්සේ සමරා පින්කමක් පවත්වනු ලබන අතර, බොහෝ දෙනාට දැක ගැනීම සඳහා උන්වහන්සේගේ ඡායාරූපයක් ද ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ සවිකර ඇත්තේ, දේශනා ශ්‍රවණය කරන, පොතපත කියවන්න එන අයට උන්වහන්සේ කවුද කියා දැන ගැනීම සඳහායි.

ප්‍රංශ ජාතික පිරිස් සමඟ මා ලංකාවට පැමිණි අවස්ථාවේ උන්වහන්සේ වැඩ වාසය කළ බත්තරමුල්ලේ චිත්ත විවේකාශ්‍රමයේ දී භාවනා වැඩසටහනක් ද උන්වහන්සේගේ මඟ පෙන්වීම යටතේ පැවතුණි.

අප ස්වාමීන්ද්‍රයාණෝ ශතවර්ෂාධික කාලයක ජීවිතය නිමවා ලක්වැසි ජනතාව තුළ මතු බුදුවන අනඳ මෙත් නාහිමි නැමැති නම ඉතිරි කරමින් අපවත්ව වී වදාළ අවස්ථාවේ ඒ පූජනීය අවස්ථාවට සහභාගිවීමට මට භාග්‍ය හිමිවුණේ ඒ වනවිට මා ලංකාවට පැමිණ සිටි නිසා ය.

උන්වහන්සේගේ 125 වන ජන්ම දිනය නිමිති කරගෙන බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය පදනමේ සභාපති බඹරබොටුවේ ආනන්ද මංගල හිමියන් විසින් සංවිධානය කරන උපහාර උත්සවය මේ මහා යතිවරයාණන්ට උපහාරයක් ම වේවා !

**පරවාහැර චන්දරතන හිමි**
**ප්‍රංශයේ සිට**



# සුව ගෙනදෙන ආත්ම දමනය

**පින්වතුනි,**
**සැවැත්නුවර ඉසුරුමත් පවුලක දෙමාපිය දෙපළක් අගසවු සැරියුත් මහරහතන් වහන්සේට සිව්පසයෙන් නිති උපස්ථාන කරති. ඔවුනට පිනැති පුත් රුවනක් ලැබිණ.**

එම කුමරු මව්කුස පිළිසිඳගත් තැන් පටන් නිවසෙහි වෙසෙන සියලුදෙනා ම සුව සම්පතින් පිනා ගිය හ. දුක් දෙම්නස් රෝග පීඩා යනාදී බාධක දුරු විය. මෙම කුමරු උපන් පසු ඔහුට නම් තැබීම සඳහා සැරියුත් මහරහතන් වහන්සේට ආරාධනා ලැබිණ. කුමරු මව්කුස පිළිසිඳගත් දා පටන් පවුලේ සියලුදෙන සුව සේ වැඩුණු බව දත් උන් වහන්සේ කුමරුට "සුඛ කුමාර" යන නම තැබූ හ.

යහතින් වැඩෙන කුමරු සත් හැවිරිදි වියේ දී පැවිදිවීමට කැමැත්තක් දැක්වීය. සැදැහැවත් දෙමාපියෝ සැරියුත් මහතෙරුන් වහන්සේ ගේ ශිෂ්‍යයකු ලෙස කුමරු පැවිදි කර වූ හ.

පැවිද්දෙන් පසු පණ්ඩිත සාමණේර නම ලෙස හැඳින්විණ. දිනක් සැරියුත් මහතෙරුන් සමග පණ්ඩිත සාමණේර නම පිඬුසිඟා වඩිමින් සිටිය හ. අතරමග දී ඇළ මාර්ග ඔස්සේ ඒ ඒ තැන් කරා දිය ගෙන යන්නන් පිරිසක් සාමණේර නමට දැක ගැන්මට ලැබුණි. මොවුහු කුමක් කරත් දැ යි, සැරියුත් තෙරුන් ගෙන් විමසී ය. මොවුන් කුඹුරු වගාවන් සඳහා ඒ ඒ තැන් දක්වා ජලය ගෙනයන බව සැරියුත් තෙරණුවෝ වදාළ හ.

තවත් මද දුරක් ගමන් කරන විට සාමණේර හිමියන්ට දැකගත හැකි වූයේ ඊතල ගින්නෙන් තවමින් ඇස් අගින් බලා ඇද හරින හී වඩුවන් පිරිසකි.

තවත් මද දුරක් ඉදිරියෙන් ලී දඬු නැවීම්, ඇද හැරීම් යනාදී සියුම් වැඩ මගින් රථවල නිම්වළලු සකස් කරන පිරිසක් දැකගත හැකි විය.

පසුව පිණ්ඩපාත ගමන නතර කළ සාමණේර හිමි විහාර ගෙය තුළට පිවිසියේ ය. මග දී දුටු මෙම සිද්ධි තුන නිමිති වශයෙන් ගෙන තමා ම තමන් දමනය කරගත යුතු ආකාරය නුවණින් මෙනෙහි කිරීමට තරම් උන් වහන්සේ ප්‍රඥාවන්ත වූ හ.

සිත් පිත් නැති ජලය වැනි ඉතා සියුම් දේත් යකඩ, ලී දඬු වැනි ඉතා තද දේත් කීකරු කොට ඒ ඒ කාර්යයෙහි යොදා ඉන් ප්‍රයෝජන ලබන අයුරු නුවණින් මෙනෙහි කළ හ.

සිත නොයෙක් අරමුණු කරා විසිර යා නොදී එක් අරමුණක තබා ගත් හ. සහජයෙන් ම නුවණැති උන් වහන්සේ තමා ගේ සිත තමා විසින්ම පාලනය කරන ලදුව මාර්ගඵලාවබෝධය ලැබූ හ.

මෙම අපූර්ව සිදුවීම නිමිති කරගත් බුදුරජාණන් වහන්සේ දම් සභා මණ්ඩපයේ දී මෙසේ වදාළ හ.

**උදකං හි නයන්ති නෙත්තිකා**
**උසුකාරා නමයන්ති තෙජනං**
**දාරුං නමයන්ති තච්ඡකා**
**අත්තානං දමයන්ති පණ්ඩිතා**

දියාලුවෝ (වාරිමාර්ගකරුවෝ) තමන් රිසි තැනට දිය පමුණුවති. හී වඩුවෝ හී ඇද හරිති. ලී වඩුවෝ ලී දඬු තමන් රිසි අතකට නමති. නුවණැත්තෝ තමන් දමනය කරති.



## නිකිණි අව අටවක පෝද
## දම් දෙසුම

මෙමගින් ඉගැන්වෙන්නේ ආත්ම දමනය පිළිබඳව යි. පාලි භාෂාවෙහි "අත්ත" යන පදයෙහි "ආත්මය" යන තේරුමක් නොමැත. එමගින් "තමා" යන සරල අර්ථය ගෙන දෙයි. සුප්‍රකට "අත්තාහි අත්තනො නාථො" යන පාඨයෙහි අදහස ද "තමා ම තමාට පිහිට ය" යන්නයි. මහා පරිනිබ්බාන සූත්‍රයෙහි එන "අත්ත දීපා විහරථ අත්තසරණා අනඤ්ඤ සරණා" යන්නෙන් කියැවෙන්නේ ද තමා දිවයිනක් හෙවත් පිහිටක් කරගෙන තමා සරණ කරගෙන අනෙකෙකු සරණ කර නොගෙන වෙසෙනු, යන්නයි. මේ අනුව විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ ඖෂධ භාවිත කිරීමෙන් රෝග සුවය සිදු වන්නාක් සේ ධර්මයෙහි හැසිරීමෙන් ම ආත්ම දමනය සිදුවන බව යි.

කෙලෙස් මැඩීම පිණිස ගන්නා උත්සාහය මෙහි දී ප්‍රධානත්වය ගනියි. කාම රාගය දුරු කිරීමට කායගතාසතිය හෙවත් පිළිකුල් භාවනාවත්, ක්‍රෝධය දුරු කිරීමට මෛත්‍රී භාවනාවත්, ඊර්ෂ්‍යාව දුරු කිරීමට මුදිතාවත් මෙහි දී මහෝපකාරී වෙයි. ආත්ම දමනයේ විශේෂ ලක්ෂණය ඉවසීමයි.

සුනාපරන්තයේ පුණ්ණ හිමි බුදු රදුන් සමඟ කළ සංවාදය ඊට වැදගත් ම නිදසුනකි.

දිනක් පුණ්ණ හිමි ස්වකීය ගමට යනු කැමැතිව බුදුරදුන් වෙත ගොස් භාවනා කිරීමට කමටහන් ඉල්ලා සිටියේ ය. එවිට බුදුරදුන් විමසූයේ, පුණ්ණ, සුනාපරන්තවාසීන් ඉතා නපුරු ය. චණ්ඩ ය. එහි දී ඔවුහු ඔබට බනිත් නම් තර්ජනය කරත් නම් කෙසේ සිතන්නෙහි ද?

එවිට පුණ්ණ තෙරණුවෝ මෙසේ පැවසූ හ.

ස්වාමීනි, මට ඔවුන් බැන්නත්, තර්ජනය කළත් අතින් පයින් නොගසනු ඇත. එහෙයින් ඔවුන් හොඳ මිනිසුනැ යි, මම සිතමි.

බුදුරදුන් : ඔවුන් අතින් පයින් ගැසුවොත් කෙසේ සිතනවා ද?

පුණ්ණ හිමි : අතින් පයින් ගැසුවත් ගල් මුල්වලින් නොගසනු ඇත. එහෙයින් ඔවුන් හොඳ මිනිසුනැ යි, සිතමි.

බුදුරදුන් : ගල් මුල්වලින් ගැසුවොත් කෙසේ ද?

පුණ්ණ හිමි : එසේ වුවත් ඔවුන් මට පොලුවලින් නොගසනු ඇත. එහෙයින් ඔවුන් හොඳ මිනිසුනැ යි, සිතමි.

බුදුරදුන් : පොලුවලින් ගැසුවොත් කෙසේ ද?

පුණ්ණ හිමි : ආයුධ වලින් පහර නොදෙනු ඇත. එහෙයින් ඔවුන් හොඳ මිනිසුනැ යි, සිතමි.


බුදුරදුන් : ආයුධවලින් පහර දුන්නොත් කෙසේ ද?

පුණ්ණ හිමි : ආයුධවලින් පහර දුන්නත් ඔවුන් මා නො මරනු ඇත. එහෙයින් හොඳ මිනිසුනැ යි, සිතමි.

බුදුරදුන් : මැරුවොත් මරණ විට කෙසේ සිතනවා ද?

පුණ්ණ හිමි : භාග්‍යවතුන් වහන්ස, ශරීරය හා ජීවිතය ගැන කළකිරී දිවි නසා ගැනීමට ආයුධ සොයන පැවිද්දෝ ද බුදු සසුනෙහි සිටිති. මට එය නො සොයා ම ලැබුණේ යැයි, සිතමි.

එම පිළිතුරු අසා ඉමහත් ප්‍රසාදයට පත් බුදුරජාණන් වහන්සේ සාධු නාද දී "මෙතරම් ඉවසීමක් ඇති ඔබට සුනාපරන්තයෙහි විසිය හැකි වන්නේ යැ" යි වදාරා සමුදුන් හ. පුණ්ණ තෙරණුවෝ ස්වකීය ගම වූ සුනාපරන්තයට ගොස් වස් වසා උවැසි උවැසියන් දහසක් පමණ ඇති කොට බවුන් වඩා රහත් වූ හ. ඒ ආත්ම දමනයෙහි බලය යි.



ඌරුගමුවේ
අස්සජී හිමි

# සසර සරන තුරු අසරණ නොවීමම නම්

'ශරීර රකින යහළුවන්ට අමතර ව සිත රකින, තමන් නියමිත දිශාවට මෙහෙයවන, ආධ්‍යාත්මය දියුණු කර ගැනීමට උදව් කරන මිතුරන් සමීප කර ගත යුතු ය. ඇති තැන මෙන් ම නැති තැන ද මිත්‍රත්වය අත්නොහරින ස්වභාවයක් අවශ්‍ය ය.'

**අනාථ වීම යනු පිහිටක්, සරණක්, හව්හරණක්, උදව්වක්, සහයෝගයක් නොලැබ අසරණ වීමයි. අනාථ නොවී සනාථ වීම හෙවත් පිහිට ඇතිව වාසය කිරීම වැදගත් වේ. අනාථවීම නොයෙක් ආකාරයෙන් සිදුවිය හැකි ය.**

මෙවැනි කාලසීමාවක දී රෝගීවීම මත කෙනෙක් අනාථ වේ. මව්පියන් අහිමි වීම හෝ අත්හැර යාම මත දරුවන් අනාථ වේ. දරුවන්ගේ නොසැලකිල්ල නිසා මව්පියන් අනාථ වේ. ඇතැම්විට තරුණ ගැහැණු දරුවන්, පුංචි දියණිවරු විවිධ හිරිහැරවලට පත්වේ. එය ද අනාථවීම යන වචනයෙන් හඳුන්වනු ලැබේ. මේ මත අනාථ නිවාස, වැඩිහිටි නිවාස, පුනරුත්ථාපන මධ්‍යස්ථාන, පරිවාස ආයතන ඇතිව තිබේ. මේ සියලු අනාථවීම සර්ව සම්පූර්ණ අනාථ භාවයක් නොවේ.

එක් පැත්තකින් පිහිටක් නොලබන බව මත සෑම පැත්තෙන් ම කෙනෙක් අනාථයකු නොවේ. එක් දෙරක් වැසුණ ද තවත් එවන් දෙර දහය දෙළහක් විවෘත වනු ඇත.

දරුවකුට මව්පියන් අහිමිවීම මත රැකවරණය ආරක්ෂාව අහිමි වේ. එනමුත් උත්සාහය හා අන්‍ය උදව් මත ලෝකය දිනන්න ඒ දරුවාට හැකියාව ලැබේ. එවන් දරුවන් ලෝක ඉතිහාසයේ දුලබ නොවේ.

අනෙක් කාරණාවන් ද මෙසේ ගලපා ගත හැකි ය.

බුදු දහමට අනුව සියලු දේ සම්පූර්ණ වූවත් මිනිසුන් අනාථවන අවස්ථා ඇත. ඒ අනාථවීම මුලින් සඳහන් කළ අනාථවීමට වඩා භයානක ය. අ.නි. සසක නිපාතය පළමු නාථකරණ සූත්‍රය තුළ දී දේශනා කරනුයේ අනාථ නොවී සනාථ වීමට අවශ්‍ය කාරණා 10ක් ඇති බව ය. යම් භික්ෂුවක් හෝ ගිහියකු මේ කාරණා තමන්ගේ ජීවිතයට එක්කර ගන්නේ නම් ඔවුන් දෙලොව ම සනාථ කරගනු ලබන බවයි. එසේ නොවන අය දුක සේ ජීවත් වේ. එම නාථකරණ ධර්ම මෙසේ ය.

සිල්වත්වීම, බහුශ්‍රැතවීම, කල්‍යාණ මිතුරන් ඇති බව, සුවචවීම, තමාට වඩා වැඩිහිටි අයගේ උපදෙස් ගැනීම, පෙළ දහම නිවැරැදිව ඉගෙන දේශනා කිරීම, අකුසල් නොකිරීම, කුසල් වැඩීම , ලැබෙන සිව්පසයෙන් තෘප්තිමත්වීම, සිහියෙන් යුක්ත වීම, ප්‍රඥාවෙන් යුක්තවීම.

මෙම ධර්ම තමන්ගේ ජීවිත තුළ පුරුදු කරන්නේ නම්, ජීවිත සනාථ කර ගත හැකි වේ. මෙහි දී සීලය යනු නික්මීමයි. එසේ කුමන සීල කණ්ඩයකදී වුව ද ගැටලුවක් නොවේ. සීලය ආණ්ඩුවක්. ආණ්ඩුවේ කාර්යභාරය පාලනයයි. සියල්ලෝ ම සීලය තුළ, පිහිටන්නේ නම් ඒ හැමෝ ම තුළ ආණ්ඩු පවතී. එහි දී අමුතු නීති මාලාවක් අවශ්‍ය නොවේ. අසංවරය, ස්වයං විනයක් නැතිකම බොහෝ ප්‍රශ්න නිර්මාණය කිරීමට සමත් වේ. අවිගත් කණ්ඩායම්, විවිධ අපචාර, සමාජ විරෝධී ද නිර්මාණය වන්නේ එහි ප්‍රතිඵල මත ය.

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව බහුශ්‍රැතවීමයි. සියල්ල දන්නා බව පමණක් බහුශ්‍රැතවීම නොවේ. අසන ලද, ධාරණ කරන ලද ද පිරීම හෙවත් ප්‍රායෝගික ව සිදුකිරීමට ඇති හැකියාව ඇසූ පිරූ යන්නෙන් ගම්‍ය වේ.

එක් ගාථාවක් හෝ නිවැරැදි ව අසා එය පිරීම ඉතා වැදගත් ය. ඒ අර්ථසම්පන්න බව සෑම ක්ෂේත්‍රයක ම දැකිය හැකි වනු ඇත. ශරීර රකින යහළුවන්ට අමතර ව සිත රකින, තමන් නියමිත දිශාවට මෙහෙයවන, ආධ්‍යාත්මය දියුණු කරගැනීමට උදව්කරන මිතුරන් සමීප කර ගත යුතු ය. ඇති තැන මෙන් ම නැති තැන ද මිත්‍රත්වය අත්නොහරින ස්වභාවයක් අවශ්‍ය ය.

එවන් සංවේදී අවස්ථාවක් අප පසුගිය දින අත්වින්දෙමු. එනම් හිටපු අමාත්‍යවරයකු මිය ගිය මොහොතේ දේහය දවන තැනට පැමිණි හිටපු ජනාධිපතිනියක ඒ දුම් කවුළුව දෙස බලා සිටින ආකාරයයි. ඇයගේ දේශපාලනය කවරක් වූව මිත්‍ර ආකල්ප ඉතා වැදගත් ය. එවන් අවස්ථා දුලබ ව හෝ අප සමාජයෙහි වර්තමානයෙහි ද දැකිය හැකි ය.

අන්‍ය මතයට ඇහුම්කන් දී කීකරු වීම, උද්ධච්ච නොවී අනතිමානී ගුණයෙන් යුක්තවීම, ජීවිතය සනාථකර ගැනීමට මහත් රුකලකි.

එමෙන් ම තමාට වඩා වැඩිහිටි සිල්වත්, ගුණවත් අයගේ අවවාද අනුශාසනා ගැනීම, ඒ මත හික්මීම තවත් යහපත් ගුණයකි. මන්දයත් තමන් සියල්ල නොදන්නේ ය.

යමෙක් නොදන්නා බව දන්නේ නම් එය මහත් පණ්ඩිතකමකි. එසේ නොවීම මත තමා අසාර්ථක කෙනකු වේ. එමෙන් ම ඒ මත සමාජය අයහපතට ඇදදමයි.

මෙහි දී විශේෂයෙන් ම භික්ෂුවක් නම් මුල් බුදු දහම නිවැරැදිව හඳුනාගෙන බුද්ධ වචන නිවැරැදිව දේශනා කිරීම කළ යුතු වේ.

ගිහියකු නම් තමන්ගේ විෂය ක්ෂේත්‍රය මනාව හඳුනාගෙන එයින් සිදු කළ හැකි සේවාව අවංකව සිදු කිරීමට වග බලාගත යුතු ය.

එසේ නොවන විට තමන් සහ තමන් නියෝජනය කරන ක්ෂේත්‍රය විනාශ වී යනු ඇත.

අකුසලයෙන් ඈත්ව කුසල් වැඩීමට විශේෂයෙන් මේ කාලයෙහි කටයුතු කිරීම ඉතාම වැදගත් වේ. මන්දයත් පින් කළත්, පව් කළත් මරණ ධර්මයට යටත් ය. කුසල් වැඩීම සසර ගමන කෙටි කර ගැනීමට මඟකි. අප සියල්ලෝ වහවහා උත්සාහ කළ යුත්තේ සසර ගමන කෙටි කර ගැනීමට ය. ඒ අරුතින් අකුසලයෙන් ඈත්ව කුසල් වැඩීම අවශ්‍ය වේ. මහච්ඡතාවයට පත්ව අසීමිත ව ධන ධාන්‍ය හෝ සිව්පසයට ගිජුවීම අනාථවීමට හේතුවකි. ඒ තුළ අනාථ වන්නේ තමන් පමණක් නොවේ. එවන් සිතුවිලිවලින් යුක්ත මිනිසුන් ජීවත්වන සියලු ක්ෂේත්‍ර අනාථ වේ. එහෙයින් ලද දෙයින් සතුටු වී අල්පේච්ඡතාවෙන් තම ජීවිතය ගත කිරීමට අදිටන් කර ගැනීම ජීවිත සනාථ කර ගැනීමට ඉවහල් වේ.

එළඹ සිටි සිහියෙන් ජීවිතය ගත කිරීම හෙවත් සම්මා සතිය ජීවිත සනාථ කර ගැනීමට අත්‍යවශ්‍ය අංගයකි.

විශේෂයෙන් මෙවන් කාලයක සිදු කරන සෑම කටයුත්තක දී ම යෝනිසෝමනසිකාරය ඉතා වැදගත් වේ.

සිහිය යනු මේ මොහොතයි.

අතීතයේ හෝ අනාගතයේ නොසිට මේ මොහොතේ කටයුතු කිරීම වැදගත් ය.

මෙහි අවසන් කාරණය ප්‍රඥාවයි. යහපත, අයහපත, සදාචාරය, දුරාචාරය, පින, පව, සරු, නිසරු ද දැනගෙන ක්‍රියා කිරීම මත ජීවිත කොහෙත් ම අනාථ නොවේ. මව පියා භාරකරු අහිමිවීම මත ඇතිවන අනාථ බව සසර හෝ නිවැරැදි කර ගැනීමට මෙම ගුණයන් වැඩීම වැදගත් ය.



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ**
**ධම්මින්ද හිමි**



# ශ්‍රී ලංකාවෙන් ලෝකයට දිය හැකි අනර්ඝතම වස්තුව

# නිර්මල බුදුදහම යි

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ**

**මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ තායිවානයේ ප්‍රධාන සංඝනායක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ අධ්‍යක්ෂ කැලණිය මානෙල්වත්ත ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ නිර්මාතෘ සහ උපකුලපති කැලණිය මානෙල්වත්ත විහාරාධිපති**

**ආචාර්ය බෝදාගම චන්දිම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**දෙස් විදෙස් සම්භාවනාවට පාත්‍ර වූ කීර්තිමත් ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ජාතික සහ ජාත්‍යන්තරව සුවිසල් කාර්ය භාරයක් ඉටුකරන බව ප්‍රකටයි. කැලණිය මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයේ නිර්මාතෘවරයා වශයෙන් යමකු විස්මයට පත්වන තරම් මේ සා විශාල කාර්යභාරයක් සිදුකිරීමට ශක්තිමත් වුණේ කොහොම ද ? නායක හාමුදුරුවනේ,**

මහනුවර වැලිවිට සංඝරාජ කෞතුකාගාර විහාරාධිපති කන්දක්කුලමේ නායක හාමුදුරුවන් වහන්සේ මානෙල්වත්ත ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා මට බාර කළා. හිටපු ජනපති ජේ.ආර්. ජයවර්ධන මහතා සහ එළීනා ජයවර්ධන ආර්යාව තමන්ගේ දේපළ මහනුවර වැලිවිට සංඝරාජ කෞතුකාගාර විහාරස්ථානය වෙත පූජා කර තිබෙනවා. ඒ වගේම මෙම මානෙල්වත්ත ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යාපන ආයතනයක් කළ යුතු බවත්,සතරදිගින් වඩින මහා සංඝ රත්නයට උපස්ථාන කළ යුතු බවත්, නවාතැන් පහසුකම් සැපයිය යුතු බවත්, එය අංග සම්පූර්ණ විහාරස්ථානයක් කළ යුතු බවත් තඹ පත්වල සඳහන් කර තිබෙනවා.

එහෙත් එම කාර්යය ඉටු කර ගැනීමට නායක හාමුදුරුවන්ට අවස්ථාව ලැබිල නැහැ. උන්වහන්සේ මැලේසියාවට වැඩම කළ අවස්ථාවක මැලේසියාවේ සංඝනායක කිරින්දේ ශ්‍රී ධම්මානන්ද නායක හාමුදුරුවන් වහන්සේට මානෙල්වත්ත පිළිබඳව දන්වා තිබූ අදහස් අනුව කිරින්දේ ධම්මානන්ද නායක හාමුදුරුවන් වහන්සේ එම තොරතුරු මා වෙත දන්වන්නට යෙදුණා. ඒ අවස්ථාවේ මම තායිවානයේ වැඩ සිටියේ. ලංකාවට වැඩම කළ වහාම කන්දක්කුලමේ ධම්මකිත්ති නායක හාමුදුරුවන් වහන්සේ බැහැ දැකපු අවස්ථාවේ උන්වහන්සේ එම භාරදූර කාර්යය මා වෙත පවරන්නට යෙදුණා.

2003 වර්ෂයේ දී මානෙල්වත්ත බාර ගන්නා විට වසර 20 ක් පුරා මහා කැලෑවකින් වැසී තිබුණ විශාල භූමි භාගයක්. ඒ වන විට එම ප්‍රදේශයේ සිටින සර්පයන්, සුනඛයන් වැනි සතුන් එම කැලෑබද ප්‍රදේශයට රැගෙනවිත් දමනවා. මම එම ස්ථානයට වැඩම කළ අවස්ථාවේ දී ම සමස්ත ලෝකයටම බුදු දහම බෙදා දෙන ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානයක් කරනවා යන හැඟීමෙන් අධිෂ්ඨානයක් ඇති කරගත්තා. එහිදී වසර දහසකට පෙර ඉන්දියාවේ පැවතුණ නාලන්දා විශ්ව විද්‍යාලය මගේ මතකයට නැගුණා. ඒ වගේ විශ්ව විද්‍යාලයක් මෙතෙක් ලෝකයට බිහිවෙලත් නැහැ. ලෝකය පුරා වැඩ සිටින ථේරවාද, මහායාන,වජ්‍රයාන යන සියලුම උගත් ස්වාමීන් වහන්සේලා බිහිවුණේ නාලන්දා විශ්ව විද්‍යාලය තුළින්.

එවැනි නාලන්දාවක් නිර්මාණය කරනවා යන අධිෂ්ඨානයෙන් යුතුව වැඩ කටයුතු ආරම්භ කළා. අපේ හිටපු ජනපති මහින්ද රාජපක්ෂ අගමැතිතුමා 2006 වර්ෂයේදී ස්වාමීන් වහන්සේලා දහසකට දන් පූජා කළ අවස්ථාවේදී එම ස්ථානය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ඉදිකරන ලෙස සමරු පළකය පිහිටවණු ලැබුවා. 2009 වර්ෂයේදී බුද්ධ ශ්‍රාවිකා අධ්‍යාපන ආයතනය නමින් අධ්‍යාපන ආයතනයක් ලංකාවේ මෙහෙණින් වහන්සේලා වෙනුවෙන් මම ආරම්භ කළා.

එම කටයුතු ඉදිරියට කරගෙන යන අතරතුරේ 2012 වර්ෂයේ පවත්වන්නට යෙදුණ 2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් විදෙස් ගත ස්වාමීන් වහන්සේලාටත්, යුනෙස්කෝ තානාපතිවරුන්ටත් මා විසින් ආරාධනා කළා.

එම අවස්ථාවේදී මෙවැනි ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය ඔවුන් ඉදිරියේ ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබුණා. එහිදී එවකට ජනපතිව සිටි වර්තමාන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ කළ සාකච්ඡාවේ දී ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය වෙනත් ස්ථානයක ඉදිනොකරන ලෙසත්, එය මානෙල්වත්තේම ගොඩනැඟීමට කටයුතු කරන ලෙසත් එතුමා ප්‍රකාශ කරන්නට යෙදුණා. එදා සිට සැලසුම් කරමින් 2013 වර්ෂයේදී මානෙල්වත්ත ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීමට මුල්ගල තැබුවා. එම කාලය තුළ මට හිතවත් විදේශීය සියලු දායකයන් මෙම භාරදූර කාර්යභාරය සඳහා උදව් උපකාර කළා.කෝටි දහසක වියදමින් විශාල ගොඩනැඟිලි 11 ක්,ශිෂ්‍ය නිවාස, සම්මන්ත්‍රණ ශාලා, පන්තිකාමර එකම සැලසුමකට අනුව ඉදිකරමින් මේ වන විට විශාල වැඩ කොටසක් කර තිබෙනවා.

වර්තමානය වන විට ආචාර්ය උපාධිය ලබාදිය හැකි තත්ත්වයට පත්කළා. ශ්‍රී ලංකාවෙන් ලෝකයට දිය හැකි අනර්ඝතම වස්තුව නිර්මල බුදු දහම යි. අපි ලංකාවට එන්නේ ලංකාවේ තිබෙන අනර්ඝතම වස්තුව වන නිර්මල බුදු දහම ලබා ගැනීම සඳහා මිස , තේකොළ ,මැණික්, ස්වර්ණාභරණ ගැනීමට නොවෙයි, යනුවෙන් විදේශීය දායකයන් ප්‍රකාශ කරනවා. අපේ ප්‍රධාන පරමාර්ථය මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලය මුළු ලෝකයටම නිර්මල බුදු දහම බෙදා දෙන ප්‍රධාන ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත්කිරීමයි.

**ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධතා ගොඩනඟාගැනීමට පසුබිම සකස්වුණේ කොහොමද? අපේ හාමුදුරුවනේ,**

මම මුලින්ම අධ්‍යාපන කටයුතු සඳහා තායිවානයට වැඩම කළා. තායිවානය මහායාන රටක්. මම තායිවාන විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන කාල පරිච්ඡේදයේ දී පොත් පත් මුද්‍රණය කරන ථේරවාදී බෞද්ධ අධ්‍යාපන ආයතනයකට සම්බන්ධ වුණා. පොත් මුද්‍රණය වෙලා තිබුණේ චීන භාෂාවෙන් පමණයි. ඒ අවස්ථාවේදී මගේ පූර්ණ සහයෝගය ලබාදෙමින් භාෂා 30 කින් ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කිරීම ආරම්භ කළා. සෑම වර්ෂ යකදීම මුළු ලෝකයේම රටවලට වැඩම කරමින් ඒ රටවල සිටින මගේ දායකයන්ගේ ආරාධනා අනුව විවිධ භාවනා වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් , අටසිල් සමාදන් කරමින් මිනිසුන්ට යමක් ලබා දුන්නා. ඔවුන් ලංකාවට පැමිණි විට මා කෙරේ විශ්වාසයක් ගොඩනඟා ගත්තා. බුරුමය,මියන්මාරය තුළ ගෙවල් දහස් ගණනක් ඉදිකර තිබෙනවා. මේ සියලු දේ කිරීම සඳහා ඇතිකර ගත්තේ විශ්වාසය පමණයි. අපි නිවැරැදිව කටයුතු කරනවා නම් මිනිස්සු අප කෙරේ තබන විශ්වාසය තුළින් අපට සියලු දෙය ජයගත හැකියි.

වසර 35 ක් පුරා එදා සිට හිත්වත් වුණු විදේශීය දායකයන් මාත් සමඟ තවදුරටත් සිටින්නේ ඔවුන් මා කෙරේ තබා තිබෙන විශ්වාසය නිසයි. සුනාමි අවස්ථාවේ ලංකාවට ගෙවල් දහසකට අධික ප්‍රමාණයක් ඉදිකර දුන්නා. ළදරු පාසල්, අනාථ ළමා නිවාස නිර්මාණය කළා. බණ්ඩාරගම ධර්මචක්‍ර ළමා පදනම පිහිටුවා විශාල සේවා රැසක් සපයනවා. මේ සියලු දේ සඳහා මට උපකාර කරන්නේ විදේශීය දායකයන්. මම යුනෙස්කෝ වේ වසර 3ක් වෙසක් උත්සවය පැවැත්වූවා. ඒ මිනිසුන්ට අවශ්‍ය කරන නිර්මල බුදු දහම ලබා දෙනවා නම්, ඔවුන් අපට ශක්තිය ලබා දෙනවා.

**ඔබ වහන්සේ ලාංකේය ශාසනික ප්‍රබෝධය පිළිබඳව කෙබඳු මතයක් දරනවාද?**

ලංකාවේ ඇතැම් භික්ෂූන් වහන්සේලා කළ යුතු කාර්යය නොවෙයි කරන්නෙ. බොහොම කනගාටුයි. ලෝකයේ කොහෙවත් නැති වටිනා නිර්මල බුදු දහමක් තිබෙන අපේ රටේ මේ ධර්මය, භාෂාව නිවැරැදිව හැදෑරුවොත් අපට මුළු ලෝකයම ජය ගන්න පුළුවන්. ඇතැම් භික්ෂූන් වහන්සේලා පෙළපාළි යමින්, පාරේ ළගිමින්, කෑකෝ ගසමින්,රැවුල කොණ්ඩ වවාගෙන, භික්ෂූත්වයට නොගැලපෙන අයුරින් කටයුතු කිරීම සිවුරට කරන අගෞරවයක්.

ශාසනය විනාශ කරන්න සිදුකරන වැඩ මිසක්, ඒ හාමුදුරුවන් වහන්සේලා නොවන බවටයි අපි ලෝකයට හඳුන්වා දෙන්නේ.

මේ බුද්ධ චීවරය දරාගෙන මුළු ලෝකයම ජයගන්න පුළුවන්කම තිබියදී අපි අපට අයිති කාර්යභාරය කරන්නේ නැහැ. නිර්මල බුදුදහම ලංකවේ තිබුණත්, එය පිළිනොපැදීම තමයි තිබෙන ප්‍රශ්නය. ධර්මානුකූල ව අවංක ව කරුණාව,මෛත්‍රිය මූලික කරගෙන සියලු දේ කළ යුතු වුවත්,. වෛරය ,ක්‍රෝධය, තණ්හාව පොදිබැඳගෙන මේ රටේ තිබෙන නිර්මල බුදු දහමට හානි කරන ඇතැම් පිරිසක් මේ රට තුළ සිටිනවා.

හේමමාලා රන්දුනු

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

නිකිණි අව අටවක 2021.08.30

## රැකවරණය ලැබීමට

බුදුරදුන් දවස මහාලී නම් ලිච්ඡවී කුමාරයෙක් විය. දිනක් ඔහු බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ, පිළිසඳර කතාවෙන් පසු ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයා දැක තිබේදැයි විමසීය.

එවිට බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ තමන් වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයා දැක ඇති බව ය. එහෙත් මහාලීට එය විශ්වාස කළ නොහැකි විය. ඔහු පැවසුවේ ශක්‍ර දේවේන්ද්‍රයා දැකීම ඉතා ම දුෂ්කර දෙයක් බවත්, බුදුරජාණන් වහන්සේ දකින්නට ඇත්තේ වෙනත් කෙනකු බවත් ය. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ, මහාලීට විස්තර කොට වදාළේ තමන් වහන්සේ ශක්‍රයා පිළිබඳ ඉතා හොඳින් දන්නා බව පමණක් නොව, ශක්‍ර පදවිය ලැබීමට පුරන ලද ගුණයන් ද දන්නා බව ය.

මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ලෙස ශක්‍ර දේවේන්ද්‍ර භාවය ලබා ගැනීමට හේතු වූයේ හෙතෙම මනුෂ්‍ය ආත්ම භාවයක් ලබා සිටියදී සප්ත ව්‍රත පද නොකඩවා පූරණය කළ බැවිනි.

දිවි තිබෙන තුරු මව්පියන් රැක බලා ගැනීම, කුල දෙටුවන් පිදීම, මොළොක් බස් කතා කිරීම, කේලාම් නොකීම, මසුරුකම දුරුර දන් දීම, සත්‍යවාදීත්වය හා කෝප නොගැනීම යන ප්‍රතිපත්ති හත ය.

මේ සප්තවත පද සිහි කැඳවීම මෙකල අතිශයින් වැඩදායක බව පෙනෙන්නේ ඇතැම් කෙනෙක් හිතා මතාම මේ ගුණධර්ම බැහැර කොට ඇති සැටි හොඳින් අසන්නට, දකින්නට ලැබෙන නිසා ය. මෙකල ජීවත්වන කිසිවෙක් මෙතෙක් අත්නොවිඳි අභාග්‍ය සම්පන්න මහා ව්‍යසනයකට අද අපි සමස්ථයක් ලෙස මුහුණ දෙමින් සිටිමු. සියල්ල උඩුයටිකුරු වී ගොසිනි. කෙනෙකුට කුසට අහරක් සොයා ගැනීමේ සිට බොහෝ අර්බුදයන්ට මුහුණ දෙන්නට සිදුව තිබේ. ඒ සොබා දහමේ ස්වභාවයයි. මේවාට මුහුණ දෙමින් ජීවිතය ජය ගන්නට වෙර දරනවා විනා අප කිසිවෙකුටත් ඉන් බැහැර විය නොහැකි ය. එමෙන් ම අප වෙත පැවරී ඇති යුතුකම් වගකීම්වලින් ද මඟ හැර සිටිය නොහැකි ය.

අප මෙලොවට බිහි කළ අපේ මව්පියන් රැක බලා ගැනීම ඒ අතර ප්‍රධාන ය. පසුගියදා අසන්නට ලැබුණ දුක්බර සිදුවීම් අතර එක් දියණියක් මහ මඟ මිය ගිය පියාගේ දේහය අසලටවත් නොපැමිණියේ ඔහු කෝවිඩ් දහනමය රෝගය නිසා මිය යන්නට ඇතැයි ඇය සැක කළ නිසා ය. තවත් දියණියක් රෝහල් ගත කළ මව නැවත බාර ගැනීම ප්‍රතික්ෂේප කළා ය. මෙවැනි ශෝචනීය සිදුවීම් සන්නිවේදනය කරන්නේ මිනිස් දරුවන්ගේ පිරිහීම ය.

මේ අතර බොහෝ පිරිස් මව්පියන්ගේ පණ රැක ගන්නට ගන්නා අපමණ උත්සාහයන් ද වේ. එහෙත් සුළු පිරිසක් හෝ ඒ වගකීම් මඟ හැරිය යුතු නොවේ. දරුවන්ගේ මඟහැර යාම් හමුවේ කිසිදු මවක් හෝ පියෙක් හෝ අසරණ විය යුතු නොවේ. අප යම් දෙයක් මැනවින් සිහි තබා ගත යුතු වේ. ඒ මව්පියන්ට සලකන දරුවන්ට කිසිදා නොවරදින බව ය.

සත් වත පදයන්හි දැක්වූ අනෙකුත් ප්‍රතිපත්තීන් ද තමන්ගේත්, අනුන්ගේත් යහපත පිණිස ම පවතින්නේ ය. විශේෂයෙන් පීඩාකාරී මෙවන් සමයෙක මුදු මොළොක් වචනයක් වුව අන් සිත් සනසවාලීමෙහි සමත් ය. තමන්ට හැකි අයුරින් අවශ්‍ය කෙනකුට යම් පරිත්‍යාගයක් කරන්නට හැකි නම් මොනතරම් වටිනවා ද? අපට නිවැරැදි මඟ පෙන්වා දෙන කුලදෙටුවන් පිදීම කිසිම හේතුවක් නිසා මඟ නොහැරීම බෞද්ධයාගේ සිරිත ය.

ඉවසීම උතුම් තපස් ගුණයක් බව දහමෙහි සඳහන් ය. මෙකල අන් කවරදාටත් වඩා අපට බොහෝ දේ ඉවසන්නට සිදුව තිබේ. ඒ තුළ ම මේ රෝග උවදුර ජය ගන්නට මඟ සැලසේ. සරලව ම කියනවා නම්, සවන්දිය යුතු තැන සවන් දෙන්නට තරම්වත් ඉවසීමක් වර්ධනය කර ගත යුතු වේ. පාලනය කර ගත හැකි ව තිබූ භයානක රෝගයක් මේ තරම් ජීවිත බිලි ගන්නා තැනට වැටුණේ අපේ ම මිනිසුන්ට සෞඛ්‍යය මාර්ගෝපදේශ පිළිපැදීමට තරම්වත් ඉවසීමක් නොවූ නිසා ය.

ජීවිතයේ අනියත බව, සියල්ලන්ට ම එය පොදු බව අද අපි ගෙවෙන මොහොතක් පාසා ප්‍රායෝගික ව ම අත්විඳිමු. මේ සියල්ලට ම අපට රැකවරණයක් ඇත. සරණක් ඇත. ඒ ශ්‍රී සද්ධර්මයේ රැකවරණයයි.

මෙලොවට පවතින්නේ ද, එලොවට ඉතිරි වන්නේ ද තමන් කළ කී දේ පමණි. එහෙයින් යහපත පමණක් රැස් කරමු. එය ම දෙලොව රැකවරණය වන බැවිනි.

# පළඟැටියා සහ ගිනි දැල්ල

සාමාන්‍යයෙන් පළඟැටියා කියන්නේ ආලෝකයට කැමැති කුඩා සතෙක්. පහන් එළියක් දුටු සැණෙකින් පියඹා අවුත් ඒ පහන් දැල්ලෙහි ගැටීම තමයි පළඟැටියාගේ ස්වභාවය. පළඟැටියා පහන් දැල්ලට ආශා කරනවා. එහෙත් පහන් දැල්ලේ ගැටීම නිසා ඇතිවෙන පිච්චී යැමට කැමැති නෑ. පිච්චීමෙන් වන දුකට කැමැති නෑ. එහෙත් පළඟැටියාට මේ ස්වභාව දෙකම එකවර ලබා ගන්නට අවස්ථාවක් නැහැ.

කැමැති දේ ලැබුණා ම එය සතුටක්. එහෙත් ඒ සතුට ලබා ගන්නට ගිනි දැල්ලට පැනීමෙන් සිදු වන්නේ පිච්චී යාමයි. එවිට ඇති වන්නේ දුකක්. ගිනි දැල්ලට ආශා කරන පළඟැටියා බලාපොරොත්තු වන පරිදි මේ ගිනි දැල්ල ලැබීමේ සතුටත්, එයට පිච්චී නොසිටීමේ සතුටත් දෙකම එකවර ලබා ගැනීමට කිසිදා හැකියාවක් ලැබෙන්නේ නෑ.

ගිනි දැල්ල ලබා ගැනීමට නම් පිච්චී නොසිටීමෙන් ලබෙන සතුට අතහරින්නට වෙනවා. පිච්චී නොසිටීමට නම් ගිනි දැල්ල ලැබීමෙන් වන සතුට අත්හැරීමට සිදුවෙනවා. මෙහි දී පළඟැටියාට එක් පැත්තක් තෝරා ගැනීමට සිදු වෙනවා. එක්කෝ ගිනි දැල්ලට ආශා නොකොට එය අත් හැර , පිච්චීමෙන් වන දුකට අකැමැති ව ,පිච්චෙන්නේ නැතිව සිටිය හැකියි.

නො එසේ නම් ගිනි දැල්ලට ආශා කොට ,පිච්චීමෙන් වන දුකට කැමැති ව එය ලබා ගෙන දැවී දුකට පත්විය හැකියි. මේ ක්‍රම දෙක හැර වෙන ක්‍රමයක් පළඟැටියාට ඇත්තේ නෑ.

සාමාන්‍යයෙන් පළඟැටියාගේ ස්වභාවය ගිනි දැල්ලක් දුටු සැණින් එයට පැනීමයි. එසේ කරන්නේ ගිනි දැල්ලට පැනීමෙන් දැවෙනවා ය කියා නොදන්නා නිසයි. එය පළඟැටියාගේ මෝඩකමයි. කිසිදා නොලැබෙන දෙයක් ලබා ගැනීමටයි මේ මෝඩකම කරන්නේ.

ගිනි දැල්ලෙන් පීඩාවට පත් නොවී සිටීමටත් , ගිනි දැල්ල ලබා ගැනීමත් යන දෙකම එකවර සිදු කළ හැකි දෙයක් නොවෙයි. එය වටහා ගත නොහැකි පළඟැටියා ගිනි දැල්ලට ආශාවෙන් එය ලබා ගැනීම පිණිස එයට පැන තමන් අකැමැති දෙයක් හෙවත් පිච්චීමෙන් ලැබෙන දුක ලබා ගන්නවා.

මේ පළඟැටියාට වන දෙය ම දුක්ඛ සත්‍ය නිසි ලෙස වටහා නොගත් පුහුදුන් පුද්ගලයාටත් සිදුවෙනවා.

සාමාන්‍ය මිනිසා ගේ දෙ‍ර, වතු පිටි, ඉඩකඩම්වලට කැමැතියි. දූ දරුවන්ට කැමැතියි. රන් රිදී මුතු මැණික්වලට කැමැතියි. යාන වාහනවලට කැමැතියි. ඒ අජීව වස්තූන් තමන් කෙරෙන් නැතිව යනවාට කැමැති නෑ. දූ දරුවන් දෙමව්පියන් ආදීන්ට කැමැතියි. එහෙත් ඒ අය ලෙඩ වෙනවාට , වයසට යනවාට, මිය යනවාට කැමැති නෑ. එසේ වුව ද ඉපදෙන සෑම කෙනෙක් ම කෙදිනක හෝ වයසට පත්වීම, ලෙඩ වීම, මිය යාම කාටවත් වළක්වන්නට බැහැ.

ඒ අනුව බලන විට අප මේ කැමැති වන දෙය කවදා හරි වෙනස් ව යනවා. ඒවා වෙනස් වන විට ඇතිවන්නේ දුකක්මයි. යම් කෙනෙක් කාමයට කැමැති වන්නේ ද, ඒ තැනැත්තා කැමැති වන්නේ දුකට ම යි. යම් කෙනෙක් දුකට කැමැති ද, ඒ තැනැත්තා කාමයට කැමැතියි.

යෝ කාමං කාමේති, සෝ දුක්ඛං කාමේති. යෝ දුක්ඛං කාමේති, සෝ කාමං කාමේති.

වශයෙන් ධර්මයේ දක්වා ඇත්තේ ඒ ස්වභාවයයි. යමෙක් රූප , වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයට කැමැති ද, ඒ තැනැත්තා කැමැති වන්නේ දුකට ම යි. යමෙක් දුකට කැමැති වන්නේ නම් ඒ තැනැත්තා පඤ්චස්කන්ධයට කැමැතියි.

මෙහිදී අපට ඇතිවන ප්‍රශ්නය නම් ඇයි සත්වයා දුකට කැමැති වන්නේ. සැබැවින් ම බලනවිට සත්වයා දුකට කැමැති නෑ. පුහුදුන් සත්වයා සැපට කැමැතියි. දුක පිළිකුල් කරනවා. (සුඛකාමා දුක්ඛ පටික්කුලා)

එහෙත් උතුමන් දුක යැයැ සිතන දේ පුහුදුන් සත්වයාට වැටහෙන්නේ සැපයක් ලෙසිනුයි. ඒ සැබෑ දුක සැපයක් ලෙසින් සිතන නිසයි පුහුදුන් සත්වයා එයට කැමැති වන්නේ. ඒ අනුව තමන්ගේ කැමැත්ත ඇතිවුණ දේ ගැන නිසි ලෙසින් නොදකින නිසයි , අනිත්‍ය වශයෙන් නොබලන නිසයි මේ කැමැත්ත ඇති වන්නේ.

වෙනත් ලෙසකින් පවසන්නේ නම් තමන්ගේ තිබෙන අනුවණකම නිසයි. අවිද්‍යාව නිසයි මේ පඤ්චස්කන්ධ දුක වැටහෙන්නේ නැත්තේ.

යමෙක් මම කියා, මගේ කියා මට අවශ්‍ය ලෙසින් පාලනය කළ හැකි ය කියා අල්වා ගෙන සිටින මේ පඤ්චස්කන්ධය ම ජාති, ජරා, ව්‍යාධි, මරණාදී දුක් ඇති කරවන එකක් බව වටහා ගතහොත් තමන්ගේ යැයි සිතන මව, පියා, දුව, පුතා, ආදීන් ද ඒ ජරා මරණාදී දුකට පත් වෙන බව වටහා ගත හොත් , ගේ දොර, වතු පිටි ආදී දේ ද විනාශ වී යන දේ බව වටහා ගතහොත් ඒවා කෙරෙහි තණ්හාව ඇති වන්නේ නැහැ.

ඒ අනුව අප අවබෝධ කර ගත යුත්තක් වන්නේ තණ්හාව ඇති වන්නේ දුක නිසි ලෙසින් අවබෝධ කර ගන්නේ නැති නිසා බවයි.



කොළඹ බෞද්ධාලෝක මාවත
නාරද බෞද්ධ ධර්මායතනාධිපති
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**තලල්ලේ චන්දකිත්ති හිමි**

# සංඝරාජ පදවිය වෙනුවට උප සංඝරාජ පදවි පිරිනැමෙයි

## ලක්දිව සංඝරාජ පදවිය 2

පොලොන්නරු යුගයේ පටන් ටීකාචාර්ය ශාරිපුත්‍ර මහාසාමි (ක්‍රි.ව. 1165 සිට 1186 ත් 1212 ත් අතර වකවානුවක්), වෛයාකරණී මෞද්ගල්‍යාන මහාසාමි (ක්‍රි.ව. 1212-1222), සංඝරක්ෂිත මහාසාමි (ක්‍රි.ව. 1212-1266), දිඹුලාගල ආරණ්‍යක මේධංකර මහාසාමි (ක්‍රි.ව. 1266-1271), අත්තනගල්ලේ සබ්බයතිරජ ධුරන්දර අනෝමදස්සි මහාසාමි (ක්‍රි.ව. 1271-1295), පලාබත්ගල ධම්මකිත්ති මහාසාමි (ක්‍රි.ව. 1295-1337), ගගතලා කරඹවලානේ කුල ශ්‍රීවත්ත විල්ගම්මූළ මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1337-1351), අමරගිරිවස වාසී දෙවනගල වනරතන මහාසාමි සංඝරාජ (ක්‍රි.ව.1351-1369), සීලවංස ධම්මකිත්ති මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1369-1385), ශ්‍රී දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1386-1417), ජයවර්ධනපුර වනරතන මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1417-1450), සිද්ධාර්ථ ධම්මදින්නාචාර්ය විමලකීර්ති ධර්මකීර්ති මහාසාමි සංඝරාජ(ක්‍රි.ව. 1450-1464), ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටක වාගීශ්වර ගලතුරුමූළ මේධංකර මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1464-1467), ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටක වාගීශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1467-1480), වීදාගම ශ්‍රී මෛත්‍රෙය මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1480-1490), පැපිලියානේ සුනේත්‍රාදේවි පරිවේණාධිපති මංගල මහාසාමි සංඝ රාජ (ක්‍රි.ව. 1490-1501), කෑරගල පද්මාවති පරිවේණාධිපති වනරතන මහාසාමි සංඝරාජ (ක්‍රි.ව. 1501-1521), ගඩලාදෙණියේ ධර්මකීර්ති මහාසාමි සංඝ රාජ (ක්‍රි.ව. 1521-1548), අස්ගිරි ගණනායක ගුණදාගේ මහාතෙරසාමි (ක්‍රි.ව. 1548-1564), දෙවනගල රතනාලංකාර මහතෙරසාමි (ක්‍රි.ව. 1564-1592) ශ්‍රී ලංකාවේ සංඝ සමාජයේ උත්තරීතර ධානාන්තරය වූ සංඝරාජ පදවිය හොබවන ලද මාහිමිවරුන් ලෙස සඳහන් කළ හැකි ය.

යුරෝපීය ආක්‍රමණ, දේශීය රාජ්‍ය තාන්ත්‍රික ආරවුල් ආදී හේතුනිසා මෙයින් පසු සංඝරාජ පදවිය කලක් නොපැවති බව උපකල්පනය කළ හැකි ය. නැවත සංඝරාජ පදවිය ලක්දිව පිහිටුවන්නේ ස්‍යාමොපසම්පදාවනේ පසුව ය.

ව්‍යවහාර වර්ෂ 1698 දී තුම්පනේ වැලිවිට උපත ලබා සූරියගොඩ විහාරයේදී පැවිදි වූ වැලිවිට සරණංකර හිමියන් පරිහානි තත්වයේ පැවති සම්බුදු සසුන දැක සංවේග උපදවා යළි චිරස්ථිතිය පිණිස කටයුතු කිරීම අරඹන ලදි.

ධර්ම ශාස්ත්‍රීය උභය අංශයෙහි ම සිදු වී ඇති පරිහානිය දැක ඉමහත් ආයාසයකින් ස්වකීය ශාස්ත්‍රොද්ග්‍රහණ කටයුතු සිදු කොට ඒ වන විට ගෘහස්ථ ජීවිතයක් ගත කරමින් සිටි ගණින්නාන්සේ නම් දුසිල් පිරිසක් බවට පත්ව සිටි සංඝ සමාජය යළිත් සුපේශල ශික්ෂාකාමීත්වයෙහි පිහිටුවාලීමට සිල්වත් සමාගම නම් සංවිධානය අරඹන ලදී.

ගණින්නාන්සේලාගේ විවිධ වූ බාධා කිරීම් මධ්‍යයේ වුවද ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජය රාජසිංහ සහ කීර්ති ශ්‍රී රාජසිංහ යන රාජ යුගයන්හි දී අවස්ථා කිහිපයක් බුරුමය හෝ තායිලන්තයෙන් උපසම්පදාව නැවත මෙරටට ගෙන ඒම පිණිස උත්සාහයන් රාශියක් සිදු කළ බව සඳහන් ය.

වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සංඝරාජයාණන් වහන්සේගේ මෙහෙයවීම මත කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජතුමාණන්ගේ රාජානුග්‍රහයෙන් ව්‍යවහාර වර්ෂ 1753 ඇසළ පුර පසළො ොස්වක පොහෝ දින මහනුවර මල්වතු මහා විහාරයීය රාජපූජිත මංගල උපෝෂ


වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනමන ලද මල්වතු මහාවිහාරයේ රාජපූජිත උපෝෂථාගාරය

ථාගාරයේදී ස්‍යාම ජාතික උපාලි මහ තෙරුන් වහන්සේ වරප්‍රමුඛ දශ වර්ගික මහා සංඝ රත්නය වෙතින් මල්වතු විහාරයේ කොබ්බෑකඩුව, වැලිවිට, හුලංගමුවේ, බඹරදෙණියේ සහ තිබ්බටුවාවේ සාමණේරයන් වහන්සේලා ද, අස්ගිරි විහාරයේ නාවින්නේ සාමණේරයන් වහන්සේ ද උපසම්පදා ලැබීමෙන් පසු යළිත් ලක්දිව උපසම්පදා කටයුතු ඇරඹීමෙන් පසු දිවයිනේ සතරදිග්භාගයෙන් ම උපසම්පදාපේක්ෂක ව සිටි සාමණේරයන් වහන්සේලා සාමණේර භාවයෙන් ඉහළ තලයට ඔසවාලමින් අධිශීල ශික්ෂා සංඛ්‍යාත සුපරිශුද්ධෝපසම්පදාවට පමුණුවාලන ලදි.

ස්‍යාමෝපසම්පදාව පිහිටුවීමෙන් පසු එළඹි පසුවස් වසන දින කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමා විසින් කලක් පුරා පුරප්පාඩු ව පැවති ලක් සඟ සමාජයේ උත්තරීතර පදවිය වූ සංඝරාජ පදවිය වැලිවිට සරණංකර හිමිපාණන් වහන්සේ වෙත ද, මල්වතු මහාවිහාරයේ නායක පදවිය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත හිමිපාණන් වහන්සේ වෙත ද අස්ගිරි විහාරයේ නායක පදවිය උරුලෑවත්තේ ශ්‍රී පියදස්සි ධම්මසිද්ධි හිමිපාණන් වහන්සේ වෙත ද පුද දෙන ලදි.

මෙකී පදවි පිළිගැන්වීම වශයෙන් ඇත් දළ මිට සහිත විජිනිපත් පිළිගැන්වූ බව සහ ඒ වන විට ලංකාවේ පැවති විහාරස්ථාන හාරදහස් අටසියයක් වූ බවත්, එම විහාරස්ථාන දෙදහස් හාරසීය බැගින් මෙම මල්වතු සහ අස්ගිරි විහාර දෙක වෙත බෙදා දුන් බවත් සඳහන් වෙයි.

සංඝරාජ හිමියන්ගේ අභාවයෙන් පසු සංඝරාජ පදවිය ද අභාවයට පත් වී ඇත. මල්වතු අස්ගිරි උභය මහාවිහාරයේ නායක පදවිය උප සංඝරාජ පදවි ලෙස මන්දාරම්පුර පුවතෙහි සඳහන් වී ඇත.

මෙම ශාසනික ධානාන්තර පිරිනැමීමේ දී වයෝවෘද්ධත්වයට වඩා සීලාදීගුණ වෘද්ධත්වය ම උසස් යැයි සැලකූ බව, පළමුව උපසම්පදාව ලත් මල්වතු විහාරයේ කොබ්බෑකඩුව හිමියන් සහ අස්ගිරි විහාරයේ නාවින්නේ හිමියන් වෙත මෙම තනතුරු ප්‍රදානය නොකොට වැලිවිට සරණංකර හිමි, තිබ්බටුවාවේ බුද්ධරක්ෂිත හිමි සහ උරුලෑවත්තේ ධම්මසිද්ධි හිමි ආදී හිමිවරුන් වෙත පුද දීමෙන් හෙළිදරව් වෙයි.

සංඝරාජ පදවිය සහ මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය නායක පදවි පිහිටුවා දස වසක් ඇවෑමෙන් කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජතුමා උභය විහාරවාසී මහා සංඝ රත්නය රජුගේ රාජ සභාව වශයෙන් පැවති දළදා මැදුරු පරිශ්‍රයේ මඟුල් මඩුවට රැස් කරවූහ.

ස්‍යාමෝපසම්පදාව පිහිට වූ ප්‍රථම වර්ෂය තුළ උපසම්පදා වූ සංඝයා අතුරින් එක් විහාරයකින් සතළිස් නම බැගින් අසූ නමක් තෝරා, ඒ අතරින් විසි නමක් කුසපත් ඇදීම මගින් තෝරා අනුනායක පදවි පිහිටුවා කුසපත් ඇදීමෙන් තෝරාගත් භික්ෂූන් වහන්සේලා කාරක සභිකයන් වහන්සේලා ලෙස පත් කොට විංශත් වර්ගික කාරක සභා පිහිටුවා සෙසු හිමිවරුන් අනුකාරක සභිකයන් ලෙස අනුකාරක සභාවක් පත් කොට සංඝ සමාජයේ පාලන සංවිධානය ශක්තිමත් භාවයට පත් කරවන ලදි.


මල්වතු විහාරයේ පෝයගෙය තුළ දක්නට ඇති වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ සිතුවම

රජතුමා විසින් මහානායක, අනුනායක ආදී මෙම ධානාන්තරයන් ප්‍රදානය කළ ද එය සංඝ සම්මතයෙන් සිදු වූ බවට නිදර්ශනයකි මොරතොට ධම්මක්ඛන්ධ හිමියන් අනුනායක පදවියට පත් වීම. රජතුමා සමඟ විශේෂ හිතවත්භාවයකින් සිටි ස්වකීය ආචාර්යත්වයෙහිලා රජතුමා වෙතින් සම්මානිත වූ මොරතොට ධම්මක්ඛන්ධ හිමියන් මල්වතු මහාවිහාරයේ අනුනායක පදවියට පත් වෙතැයි රජතුමා අපේක්ෂා කළත්

අන්‍ය හිමිනමක් අනුනායක පදවියට පත් වූ පසු රජතුමා එම පදවිය පිරිනැමීම පිළිගෙන, ධම්මක්ඛන්ධ හිමියන් වෙනුවෙන් තවත් අනුනායක පදවියක් පිරිනමන ලෙස කළ ඉල්ලීම මල්වතු විහාරයීය සංඝයා වහන්සේලා ද පිළිගෙන ඇත. එතැන් සිට අද දක්වා ම මල්වතු විහාරයේ අනුනායක පදවි දෙකක් පවතී.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු අස්ගිරි මහාවිහාරයට අනුනායක හා ද්විතීය අනුනායක යනුවෙන් පදවි දෙකක් පත් කළ බවත් මෙම අනුනායක දෙකට ම ග්‍රන්ථ ධූරයට සම්බන්ධ හිමිවරුන් පත් වූයෙන් විදර්ශනා ධූරය සඳහා ද අනුනායක පදවියක් පත් කොට තිබේ.

මෙසේ මුල්ම අනුනායක පදවි සඳහා ග්‍රන්ථ ධූරය වෙනුවෙන් ඉඳවලුගොඩ ධම්මපාල, ඇඹව ධම්මපාල හිමිවරු ද විදර්ශනා ධූරය වෙනුවෙන් රඹුක්වැල්ලේ රතනජෝති හිමියෝ ද පත් වී වදාළහ.

**මෙම ලිපියේ ඉතිරි කොටස බුදුසරණ අමාවක පෝද (සැප්: 06) පත්‍රයේ පළවේ.**

# ජීවිතයේ සැනසීම හැසිරීම අනුවයි

**ඈත අතීතයේ කෙනෙක් මිය ගිය පසු සිරුර ආදාහනය කිරීමක් නොවුණි. සුසාන භූමියට ගෙන ගොස් දැමීම පමණක් සිදු කෙරිණි. ඉතින් එහි මළ සිරුරු බොහෝ දක්නට ලැබිණ. ඒ මළ සිරුරු අතරින් සමහරක් ඉදිමී නිල්වන් ව පැවතිණ. තවත් සමහර මළ සිරුරු මස් දියවෙමින් ද, පණුවන්ගේ වැසීමෙන් ද පැවතිණ. දිරා ගිය ඇටසැකිලි, ඒ වගේ ම විසිරී ගිය ඇට කැබලි සුන් බුන් නිසා මුළු සුසාන භූමිය ම ඉතා අපිරිසුදු ව දුර්ගන්ධය හමන තැනක් බවට පත්ව තිබිණි. යම් සේ ඒ සොහොන අපිරිසුදු වූයේ ද තිදෙර අපිරිසුදු වූ පුද්ගලයින් ද එබඳු යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. තිදෙර අපිරිසුදු වීම නම් සිත, කය, වචනය අපිරිසුදු වීම ය.**

අනුන් නසන පුද්ගලයා මොනතරම් අපවිත්‍ර පුද්ගලයෙක් ද? අනුන්ගේ පණ උදුරා ගන්නා පුද්ගලයා ධනය, බලය, පෙනුම හා ලෞකික උගත්කම් ආදියෙන් සමන්විත වුව ද කිසිවිටෙකත් සිල්වත් හෝ ගුණවත් ලෙස දහමෙහි නොලසකයි.

ඔහු හෝ ඇය ආධ්‍යාත්මික ගුණයෙන් හීන සහ අපිරිසුදු කර්ම සංස්කාර ඇත්තෙකි. ස්වල්ප හෝ මහත් වූ හෝ සොරකම් කරන්නා, සොර සිත් ඇත්තෙකි. ඒ වගේ ම කාමයෙහි වරදවා හැසිරෙන්නා ද ඉතාම අපිරිසුදු විෂම හැසිරීම් ඇත්තෙක් ලෙස සැලකේ. ඔහුගේ හෝ ඇයගේ චරිතය මෙන් ම පැවැත්ම ද සොහොනක් බඳු ව අපිරිසුදු ය.

අපවිත්‍ර වූ වාග් කර්ම ඇත්තා මුවින් අපිරිසුදු කෙනෙකි. බොරුකීම, කේලාම්කීම, එරුස වචන කීම සහ හිස්වදන් කතා කිරීම මේ පුද්ගලයාගේ හැටි ය. මෙවැනි පුද්ගලයෙක් ලස්සන ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී සිටිය ද මුවින් අපිරිසුදු නම් ඔහුගේ හෝ ඇයගේ බාහිර පිරිසුදුකමින් ඇති ප්‍රයෝජනය කුමක් ද? ඔහු හෝ ඇය හෝ චරිතයෙන් හා පැවැත්මෙන් දූෂිත වූ අයෙක් බවට පත් වේ. මේ ආකාරයෙන් අපිරිසුදු පුද්ගලයා කාලයට හෝ තැනට නො ගැළපෙන දෙයක් ම කියයි. සිදු නොවූ දෙයක් හෝ බොරුවක් ම හෝ කියයි. අර්ථයක් නැති නිෂ්ඵල දෙයක් ම කියයි. අධර්ම දෙයක් ම කතා කරයි. සංවරයට හෝ ශික්ෂණයට නොගැළපෙන්නක් ම කියයි.

ඒ වගේ ම මනසින් ද යම් අයෙක්, අමු සොහොනක් මෙන් අපිරිසුදු විය හැකි ය. ඒ විෂම ලෝභ සිතිවිලි නිසා ය. තමා සතු වස්තූන්හි පමණක් නොව අන් සතු වස්තූන් කෙරෙහි ද දැඩි ආශාවකින් යුතු වෙයි.

ඒ වගේ ම ද්වේෂය හෙවත් තරහවෙන් යුක්ත වේ. මැරේවා, නැසේවා, අයහපතක් ම වේවායි ප්‍රාර්ථනා කරමින් අපවිත්‍ර වූ සිත් ඇති අයෙක් බවට පත්වෙයි. ඒ වගේ ම වැරැදි දැක්මකට නතුවීමෙන් අපිරිසුදු වෙයි.

එනම් දුන් දෙයෙහි විපාක නැත. මෙය දස ආකාරයක වැරැදි දැක්මකින් යුක්ත ය. සිත, කය, වචනය නම් වූ තිදෙරින් ම මෙවැනි අය අපිරිසුදු සොහොනක් බඳු ය.

අපවිත්‍ර වූ මෙබඳු පුද්ගලයාගේ නුගුණ ම පැතිරේ. එනම්, සොහොනේ මළකුණු නිසා දුර්ගන්දය පැතිරෙන්නා සේ තිදෙරින් සිදු කරන අපවිත්‍ර කර්ම නිසා මේ පුද්ගලයා ද දුගඳ හමන පුද්ගලයෙක් බවට පත්වේ . ලෝභය, තරහව, වෛරය පිරුණු, පව පින නො අදහන, මෙලොව පරලොව ගැන විශ්වාසයක් නැති මනුෂ්‍යයෙක් ලෙසයි සාමාන්‍ය ලෝකයා මෙවැනි අය ගැන කතා කරන්නේ.මෙසේ අයහපත පැතිරෙන්නේ නම්, එය සොහොනෙන් පැතිරෙන දුගඳ හා සම බව ධර්මයේ සඳහන් ය.

අමු සොහොනක් පිළිබඳ සාමාන්‍ය මනුෂ්‍යයා තුළ යම් බියක් වේ. තැති ගැනීමක් වේ. එබඳු අපවිත්‍ර, දුගඳ හමන,බිය ගෙන දෙන පුද්ගලයෙක් පිළිබඳ ව ද සමාජය බිය වේ. සමාජය එවැනි පුද්ගලයා ඇසුරින් දුරින් ම දුරු කරයි.

පවුල් පරිසරයේ ද, රැකියා ස්ථානයේ ද, ගමේ ද, පළාතේ ද, ආගමික ස්ථානයකට ඔහු හෝ ඇය පැමිණියේ ද, ඔහුට හෝ ඇයට සිදු වන්නේ අන්‍යයන් විසින් දුරලීමෙන් ඇති වන හුදකලා බවට පත්වීමටයි. ඇසුරකට තබා සමීපයටවත් නොගත යුතු අයෙක් ලෙසයි අන් අය සිතන්නේ.

සොහොන ඇසුරු කොට අමනුෂ්‍යයන් වාසය කරන්නාක් සේ තිදෙරින් අපිරිසුදු පුද්ගලයා ද තමාට සමාන පුද්ගලයන් සමඟ වෙසෙයි.. නරක, පාපී පුද්ගලයන් වෙතට එවැනි ම පුද්ගලයෝ එකතු වෙති. කුණුවලට කුණු එකතු වන්නාක් මෙනි. සිල්වත්, සත්පුරුෂ, යහපත් පුද්ගලයන් බැහැර වෙති.

ප්‍රියශීලී ගති පැවතුම් ඇති අය අපවිත්‍ර වූ කාය, වචී, මනෝ කර්ම ඇති පුද්ගලයා හඳුනාගනී. හඳුනාගෙන “අප මෙවැනි පුද්ගලයෙක් සමඟ ඇසුරු කරනවා නම් එය ඒකාන්තයෙන් ම දුකකි‘ යැයි ශෝකයට පත්වනු ඇත.

යම් පවුලක් තුළ ස්වාමි දියණියකට, යම් වූ පාපී ස්වාමි පුත්‍රයෙක් නිසා දුකක්, ශෝකයක් ඇති වූයේ නම් “මොන කරුමයට මේ පුද්ගලයා මගේ ජීවිතයට එකතු වුණා දැයි ශෝක වෙයි. හඬා වැළපෙයි.මේ පුද්ගලයා අන් අයට හැඬීම් හා ශෝක ගෙන දෙන අමු සොහොනකි.

මේ අනුව ස්වාමි දියණියක්, මවක්, පියෙක්, දරුවෙක් හෝ යම් ඕනෑම පුද්ගලයෙක් අන් අයට දුකට ශෝකයට හේතු ගෙන දෙන සොහොනක් විය හැකි ය.

වර්තමාන සමාජයේ බොහෝ පවුල් පරිසරවල අන් අයගේ ජීවිත එකම කඳුළු ගොඩක් බවට පත් කරන පිරිස් දක්නට ලැබීම අභාග්‍යයකි. සිත, කය, වචනය නම් වූ තිදෙරින් දුසිරිත් පුරුදු කොට දුගඳ හමන සොහොනකට සමාන ජීවිතයක් නොවෙමු. තමාට මෙන් ම සමාජයේ අන් අයට ද සැනසිය හැකි සුවඳ හමන මල් උයනකට උපමා කළ හැකි ජීවිතයක් පවත්වා ගත හැකි නම් එයයි උතුම් ම මනුෂ්‍ය ජීවිතය. එයයි උතුම් මනුෂ්‍ය ජීවිතයෙන් ප්‍රයෝජන ලැබුවා වන්නේ.

**දීපා පෙරේරා**

> **‘සිත, කය, වචනය නම් වූ තිදෙරින් දුසිරිත් පුරුදු කළ, දුගඳ හමන සොහොනකට සමාන ජීවිතයක් කුමටද? තමාට මෙන් ම සමාජයේ අන් අයට ද සැනසිය හැකි සුවඳ හමන මල් උයනකට උපමා කළ හැකි ජීවිතයක් පවත්වා ගත හැකි නම් එයයි උතුම් ම මනුෂ්‍ය ජීවිතය.’**



# කේසකාරී දියණිය දෙව්ලොව ගිය හැටි



**කේසකාරී දියණිය විසුවේ කසී රටේ. බරණැස ඇය උපන් ගම යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර ඉසිපතන මිගදායේ වැඩ වාසය කළා. එදින බොහෝ භික්ෂූන් උදය කාලයේ පා සිවුරු ගෙන පිණ්ඩපාතය සඳහා ඒ ගමට වැඩම කළා.**

මේ භික්ෂූන් වහන්සේලා කේසකාරීගේ නිවස ඉදිරිපිටින් වැඩම කළේ. ඒ දියණිය ඉතාමත් ඥානවන්ත යි. නිවස ඉදිරියෙන් වඩින ඒ මහා ශ්‍රාවක පුත්‍රයන් දුටු ඇය විස්මයට පත්වූවා. කෙදිනකවත් නොදුටු සංඝයා වහන්සේ දැක ඉතා ප්‍රීතියෙන් දෑස් විදහා එදෙස බලා සිටියා.

මොනතරම් පින්බර ද? මේ සංඝයා වහන්සේ දැකීමෙන් සිත ප්‍රීතියට පත්වෙනවා. කසාවත් හැඳ පාත්‍රය දරාගෙන බිමට යොමු කරගත් දෑසින් වඩින මේ උතුමෝ කවරහු ද? ඉතාමත් සිල්වත්, පින්වන්ත මේ සංඝයා වහන්සේලාට ගිහි ගෙදර කළ කිරුණේ කිනම් කරුණක් නිසා ද? උන්වහන්සේලා කා වෙනුවෙන් පැවිදි වූයේ ද? සිතූ කේසකාරී තම මෑණියන්ගෙන් මෙසේ අසනවා.

"මෑණියනි, මේ අප ඉදිරියෙන් වඩින භික්ෂූන් වහන්සේලා ඉතාමත් මනෝභාවනීය යි. රූමත්. හැමගේ ම ප්‍රසාදය ලබන පැවිදි උතුමන් පිරිසක්. මේ සියලූම භික්ෂූන් තරුණ වයසේ නේද පසුවන්නේ? මෑණියනි, මේ භික්ෂූන් වහන්සේ කුමන හේතුවක් නිසා ගිහි ගෙදර හැර දමා තරුණ වියේදී පැවිදි වූවා ද?"

"දියණිය, ශාක්‍ය වංශයේ පුත්‍රයකු ශාක්‍ය වංශයෙන් නික්මිලා පැවිදි වී බුද්ධ නමින් ශාස්තෘන් වහන්සේ ලෙස ලොවට පහළ වෙලා. ඒ බුදුරජාණන් වහන්සේ මුල, මැද, අග යහපත් වූ අර්ථ සහිත ධර්මය දේශනා කරනවා. උන්වහන්සේ දෙව්, මිනිසුන්ට මේ සංසාර දුකෙන් එතෙර වීටමයි කියා දෙන්නේ. සියලූම සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණ දයාවකින් තමයි වාසය කරන්නේ. ඒ බුදුරජාණන් වහන්සේ ගේ ගුණ අනන්ත යි. අප්‍රමාණ යි. උන්වහන්සේ ගේ ජීවිතය පුරාවට ම කරුණාව, දයාව, ඉවසීම, තිබෙනවා. නිතරම මෙත් සිත පතුරවමින් තමයි වාසය කරන්නේ.

උන්වහන්සේ සියලූම අකුසල් දුරු කරලා ඉන්නේ. රාග, ද්වේෂ, මෝහ ප්‍රහාණය කර සියලූ කෙලෙසුන්ගෙන් නිදහස් වූ උත්තමයෙක්. දියණියනි, මේ බ්‍රහ්මචාරී පැවිදි පිරිස ඒ භාග්‍යවතුන් වහන්සේ උදෙසා තමා පැවිදි වෙලා ඉන්නේ" යැයි මව කියා දුන්නා.

ඔවුන් අසල සිටියා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කොට මාර්ගඵලයට පත් උපාසකයෙක්. කේසකාරීගේ මව

"උපාසකතුමනි, මේ කාලයේ බොහෝ කුල පුත්‍රයන් මහත් වූ වස්තුව ද, බොහෝ නෑදෑ පිරිස ද, නම්බුනාම, සිටු තනතුරු ද හැරදමා බුදුරජාණන් වහන්සේ ළඟ පැවිදි වෙනවා. එසේ පැවිදි වීමෙන් ඔවුන්ට වෙන යහපතක් තිබෙනවා ද? බොහෝ සැප සම්පත් විඳිමින් ගිහි ගෙදර වාසය කිරීමට ඉඩ තිබියදීත්, ඒ සියල්ල අතහැර දමා සිවුරු දරාගෙන, පාත්‍ර ගෙන පිණ්ඩපාතයෙන් ලැබෙන කටුක ආහාර වළඳමින් මෙසේ ඉන්නේ ඇයි? ඔවුන් සොයන්නේ මොන වගේ සැනසීමක් ද? ඒ පිරිස සොයන සැනසීම ඒ බුදුරජාණන් වහන්සේගේ ශාසනය තුළ තිබෙනවා ද?"

ඒ උපාසකතුමා කියනවා

"දියණිය, මා දන්නා ආකාරයට ඔබට කියා දෙන්නම්.

මේ පැවිදි උතුමෝ පංචකාමයෙහි ආදීනවයන් දකිමින් පැවිදි ජීවිතයේ අනුසස් දකිමින් වාසය කරනවා. තුනුරුවන් කෙරෙහි අපමණ ශ්‍රද්ධාවකින් වාසය කරන්නේ. ඒ වගේම නිති සිල් රැකීම නිසයි මේ පිරිස ප්‍රසන්න ව ප්‍රමුදිත ව වාසය කරන්නේ."

කේසකාරීදියණිය නැවත අසනවා

"උපාසකතුමනි, ඔබ කියන ආකාරයට තුනුරුවන් සරණ යාමෙන් ඒ යහගුණ අපටත් ඇතිකර ගත හැකි ද?"

"පින්වත් දියණිය, එය එසේම යි. නුඹත් අද පටන් තුනුරුවන් සරණ ගොස් ඒ ලාභය ලබා ගන්න" යැයි කියා ඇය තිසරණ සරණ පන්සිල් සමාදන් කරවූවා.

"උපාසකතුමනි, තිසරණය සමාදන් වීමට අමතරව තවත් යමක් කළ යුතුව තිබෙනවා ද?"

"මැය ඉතාමත් ඥානවන්ත යි. ධර්මාවබෝධයට සුදුසුකම් ඇති තැනැත්තියකි. එනිසා මැයට ශරීරයේ කුණුප කොටස් තිස්දෙක කියාදිය යුතුයි" සිතූ උපාසකතුමා

"දියණිය, ඔබ මේ ශරීරයේ පවත්නා කුණුප කොටස් තිස් දෙක නුවණින් මෙනෙහි කරන්න. කයට තිබෙන ආශාව දුරු කර දමන්න. වෙනස් වෙමින් තිබෙන මේ ශරීර ස්වභාවය පිළිබඳ අනිත්‍යය දකින්න" යැයි විදර්ශනා මාර්ගය උගන්වා උපාසක යන්න ගියා.

ඒ කේසකාරී කියාදුන් අන්දමට අනිත්‍ය මෙනෙහි කළා. විදර්ශනා වැඩුවා. පිළිකුල්බව වැඩීම තුළින් සිත සන්සුන් වුණා. සිල් ගුණ දම් දියුණු කළා. ඕ ටික කලකින් සක්කාය දිට්ඨියෙන් නිදහස් වුණා.

කලකට පසු ඇය කලූරිය කළා. සක්දෙව්දුගේ භවනෙහි පරිචාරිකාවක ලෙස උපත ලැබුවා. අප්සරාවන් ලක්ෂයක් පිරිවරා සිටියා.

කේසකාරී දෙව්දුව දකින සක් දෙවිඳු අසනවා "පින්වත් දෙව්දුව, ඔබ මොන වගේ පිනක් කරලා ද මේ අලංකාර දිව්‍ය විමානය පහළ වුණේ?"

"සක් දෙව්දුනි, මේ දිව්‍ය විමානය හරිම සිත්කළු යි. ප්‍රභාෂ්වර යි. වෛරෝඩි මාණික්‍යවලින් මේ විමානය සෑදී තිබෙන්නේ. රතින් කළ වෘක්ෂයන්ගෙන් හැම තැනම සුන්දර වෙලා තිබෙන්නේ. මගේ පුණ්‍ය කර්මයක විපාකයක් ලෙසයි මේ විමානය පහළ වුණේ."

"පින්වත් දෙව්දුව, කලින් මේ දිව්‍ය විමානයෙහි දිව්‍ය අප්සරාවන් ලක්ෂයක් පමණ පහළ වෙලයි ඉන්නේ. ඒ පිරිවර ඇතිව ඔබත් මෙහි පහළ වුණේ ඔබගේ පුණ්‍ය කර්මයන් නිසාම යි. ඒ කලින් උපන් දිව්‍ය අප්සරාවන් පිරිවරාගෙන ඔබ බැබළෙමින් ඉන්නේ. සුපුන් සඳ රැස් විහිදා බබළනවා. එවිට තරු එළියෙන් වැඩක් නැහැ. අහසේ සඳ මඬලමයි බබළන්නේ. ඔබත් ඒ වගේම යි. මේ අප්සරාවන් පිරිවරාගෙන දිලිහි දිලිහි යසසින් බබළනවා. පින්වත් දෙව්දුව මේ විමානයට ඔබ පහළ වූයේ කවර ලෝකයකින් චුත වෙලා ද?"

ඒ දෙව්දුව කියනවා

"සක් දෙවිඳුනි, ඔබ මගෙන් ඇසුවේ මේ දෙව් ලොවට මම ආවේ කවර ලෝකයකින් චුත වෙලාද කියලා. කසී රට බරණැස කියා නගරයක් තිබෙනවා. ඒ නගරයේ මම කේසකාරී නමින් මිනිස් දුවක් ව ඉපදී සිටියා. භාග්‍යවතුන් වහන්සේ ගැනත්, ඒ ශ්‍රී සද්ධර්මය ගැනත්, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන ගැනත් මගේ සිතේ ලොකු පැහැදීමක් තිබුණා. ඒ ශ්‍රද්ධාව ස්ථිර එකක්. මම සැක රහිතවයි ඉන්නේ. නොකඩවා සිල්පද රැක්කා. සෝවාන් ඵලයට පත්වෙලා හිටියේ. මම නියත වශයෙන් ම නිවන අවබෝධ කරන කෙනෙක්" ඇය කිය සිටියා.

සක් දෙවිඳු කියනවා.

"පින්වත් දෙව්දුව, ඒ අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිළිබඳවත්, ශ්‍රී සද්ධර්මය පිළිබඳවත්, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන පිළිබඳවත් ඔබේ සිතේ ලොකු පැහැදීමක් තිබෙනවා. ඒ ශ්‍රද්ධාව ස්ථිර එකක් ම තමා. ඔබ සැක රහිතව යි ඉන්නේ. නොකඩ කොට සිල්පද රැකගෙන සෝවාන් ඵලයට පත් වූ ඔබ නියත වශයෙන් ම නිවන අවබෝධ කරන කෙනෙක්. පින්වත් දෙව්දුව, ධර්මය නිසාත්, පිරිවර නිසාත් ඔබ බබළනවා. අප ඔබේ පැමිණීම සතුටින් පිළිගන්නවා. මෙය ඔබට සුන්දර ආගමනයක් වේවි" යි සක් දෙවිඳු කේසකාරී දෙව්දුවට කියා සිටියා.

පසු කාලයක දී මේ කතාව සක් දෙවිඳු මුගලන් මහරහතන් වහන්සේට ප්‍රකාශ කළ විට මුගලන් මහරහත් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට එය දැනුම් දුන්නා. භාග්‍යවතුන් වහන්සේ මිනිසුන්ගේත්, දෙවියන්ගේත් හිත සුව පිණිස එය නැවත වදාළ සේක.

> **"සක් දෙවිඳුනි, ඔබ මගෙන් ඇසුවේ මේ දෙව් ලොවට මම ආවේ කවර ලෝකයකින් ද කියලයි. කසී රට බරණැස කියා නගරයක් තිබෙනවා. ඒ නගරයේ මම කේසකාරී නමින් මිනිස් දුවක් ව ඉපදී සිටියා. භාග්‍යවතුන් වහන්සේ ගැනත්, ඒ ශ්‍රී සද්ධර්මය ගැනත්, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන ගැනත් මගේ සිතේ ලොකු පැහැදීමක් තිබුණා."**

නයනා නිල්මිණී

දුටුගැමුණු මහ රජතුමා 44

# පියරජතුමා අසනීප වූයේ තමන් නිසා යැයි දීඝාභයට පසුතැවීමක්



"තොපට දුටුගැමුණු කුමාරයා හමුවී තිබෙනවා ද?"

"නැහැ"

"තොප, කාවන්තිස්ස මහා රජතුමා දැක තිබෙනවා ද?"

"ඔව්, සම්මන්ත්‍රණ ශාලාවේදී දැක තිබෙනවා. අසනීප වන්නට කලින් අස්රියෙන් ගමන් කරනවා දැක තිබෙනවා"

"මෑතකදී රජතුමා සංචාරය කරනවා දුටුවා ද?"

"නැහැ, රජතුමාගේ අසනීප තත්ත්වය දරුණුයි. කිසිවකුටත් හමුවීමට අවසර නැහැ. රාජකීය වෛද්‍යවරු සිව් දෙනකු රජ මාලිගයේම නැවතී ප්‍රතිකාර කරනවා. විහාරමහා දේවියත් මහත් දුකෙන්, වේදනාවෙන් කල් ගෙවන බව ආරංචියි."

"තොප, මව් බිසවුන් වහන්සේ දැක තිබෙනවා ද?"

"ඔව්, කිහිප වරක්ම දැක තිබෙනවා. තිස්ස මහා චෛත්‍යය වැඳ පුදා ගන්නට යනවා දැක්කා."

"මා පිළිබඳ මාගම සෙනෙවිවරුන් තරහින් ද පසුවන්නේ?

"නැහැ, කුමරුනි ඔබගේ පලා යාම නිසා රජතුමා ඔත්පල වූ බවයි ඔවුන් පවසන්නේ. ඔබතුමා රටටත්, පිය රජතුමාටත්, මව් බිසවටත් ද්‍රෝහී වුණාලු."

"නැහැ, නුඹ කියන්නේ බොරු. පිය රජතුමා ලෙඩ වීමට වගකිව යුත්තේ දුටුගැමුණුයි. පිය රජතුමාට ගැහැනු ඇඳුම් පැළඳුම් යැව්වා. ගිරි රාජධානියේ ගිරි රජ්ජු පන්නා දමා බලය අල්ලා ගත්තා. මේවායින් කලකිරුණු රජතුමා අසනීප වුණා."

"ඒවා අප සියලු දෙනාම දන්නා කරුණු. නමුත් රජතුමා තදබල ලෙස අසනීප වුණේ ඔබතුමාගේ හසුන්පත තිස්ස කුමාරයාට ලැබුණු දවසේලු."

"දීඝාභය කුමාරයාගේ මුහුණේ දුක්මුසු බවක් පෙනෙන්නට විය. මොහොතක් කල්පනාවට වැටුණේ ය.

"පිය රජතුමා අසනීප වූ පසුව තොපට දැකගන්නට ලැබුණා ද?"

"නැහැ කුමරුනි, තදින් අසනීප වූ පසුව මහ රජතුමා හමුවන්නට කිසිවකුටත් අවසර ලැබුණේ නැහැ. මව් බිසවුන් වහන්සේටත්, ත්‍රිපිටකතිස්ස, මහාසිව මාහිමිපාණන් වහන්සේලාටත් හැර රාජකීය වෛද්‍යවරුන්ට පමණයි හමුවීමට අවසර ලැබුණේ. නන්දිමිත්‍ර, වේළුසුමන, සුරනිමල තිදෙනාට කැඳවීමක් ලැබුණොත් පමණක් යාමට අවසර ලැබුණා."

"තොප නැවත මාගම රාජ්‍යයට යනවාද"

"නැහැ, කිසිම අදහසක් නැහැ. ඔවුන්ට දැන් මම ජාති ද්‍රෝහියෙක්. දුටුගැමුණු ද්‍රෝහියෙක්. එළාර රජතුමාගේ හිතවත් චරපුරුෂයෙක්."

"ගැමුණු කුමාරයාට බොහෝ හිතවත් මහා සෙනෙවිවරු කවුද?"

"වෙන් වෙන් වශයෙන් කියන්න බැහැ. හැම දෙනාම ගැමුණු කුමාරයාට කැමතියි."

"තොප මෙහි සිටිමින් රහස් ඔත්තු ලබා ගන්නේ කෙසේද?"

"චූලන්ගනියේ මගේ හිතවත් සෙනෙවියකු සිටිනවා. ඔහු පරවියකු මගින් වැදගත් සිද්ධි මට දන්වා එවනවා."

" හොඳයි, ඔබ දක්ෂයකු බව පෙනෙනවා. තොපට ඉතා ඉක්මණින් මහා සෙනෙවි තනතුරක් ලැබේවි."

"ස්තුතියි මහා සෙනෙවිතුමනි"

" දැන් ආරක්ෂක කටයුතු පිළිබඳ සම්මන්ත්‍රණයට යාමට සුදුසු නැහැ. එය ආරම්භ වී හෝරාවක් පමණ ගත වෙලා. නමුත් තොප හමුවීම ඉතා වැදගත්."

"දීඝාභය කල්පනා කරමින්ම අසුපිටට නැග්ගේ ය. මහමෙව්නාව දෙසට නොව, විජිතපුර දෙසට වේගයෙන් අසු මෙහෙය විය. පිය රජතුමා තමන් නිසා අසනීප විය යන අදහස ඔහුට වේදනා ගෙන දුන් බව සිරිනාගට දැනුණි. සිරිනාග නිවසට පැමිණ ගතවූයේ සුළු මොහොතකි. මිත්‍ර සෙනෙවි ආලින්දය අසලට පැමිණ අසු පිටින් බැස සිරිනාග ඇමතුවේ ය.

"දීඝාභය කුමරු අද ආරක්ෂක සම්මන්ත්‍රණයට ආවේ නැහැ. නමුත් තොප සමග සැහෙන වේලාවක් ශ්‍රී මහා බෝධිය අසල කතා කරමින් සිටි බව ආරංචි වුණා. තොපට ඔහු මුණ ගැසුණේ කෙසේද?"

"මහා සෙනෙවිතුමනි, සුපුරුදු පරිදි ශ්‍රී මහා බෝධිය වන්දනා මාන කර පිටව යන්නට සූදානම් වන විටම දීඝාභය කුමරු පැමිණ මා නතර කළා.

"ඒ කුමක් නිසාද? ඔහුට තොප සමග අමනාපයක් තිබෙනවා ද?"

"ඔව් ඔහු මට තර්ජනය කළා.

"ඇයි ඒ"

"ඔහු අනුරාධපුරයේ චරපුරුෂ සේවයක් පවත්වාගෙන ගිය බව සම්මන්ත්‍රණයේදී එළාර රජු ඉදිරියේ මා විසින් හෙළිකිරීම පිළිබඳව"

"තොප එය ස්ථිරව ම දැන සිටියා ද?"

" නැහැ, එය සැක සහිතව එළැඹි නිගමනයක්. නමුත් දැන් එය නිවැරැදි බව පෙනෙනවා."

"ඔහු ඒ බව පිළිගත්තා ද?"

"ඔව්" මෙය අපට හොඳ කරුණක්. ඔහු අපට අවනත කර ගන්නට"

" නමුත් දැන් ඔහු එළාර රජතුමාගේ හිතවත් සෙනෙවියෙක්. දිඝජන්තුටත් වඩා එළාර මහා රජතුමාගේ විශ්වාසය දිනාගෙන

"ඒක ඇත්ත. එයින් නැතිවී යන්නේ මට ඇති තැනයි. මා දැන් තුන්වැනි තැනට වැටිලා. මේ තත්ත්වය වෙනස් කර ගන්නට සිරිනාග මට ඔබේ සහය අවශ්‍යයි."

"ඒ ගැන සැක හිතන්න එපා මහසෙනෙවිතුමනි, මම හැදුණේ වැඩුණේ ඔබතුමාගේ ගෙදර. යුද්ධ ශිල්පය ඉගෙන ගත්තේ ඔබතුමාගෙන්. අද මම මේ උපසෙනෙවි කෙනකු වී සිටින්නේ ඔබතුමා නිසයි."

"තොප ඒ ටික සිහි තබාගෙන කටයුතු කරනවා නම් හොඳටම ඇති."

මුළු දවස පුරාම අනුරාධපුර රාජධානියේ ඇවිදිමින් තොරතුරු සොයමින් ඒ බව එළාර රජතුමාට වාර්තා වන්නට සැලසීම මේ දිනවල සිරිනාගගේ රාජකාරියයි. තමන්ගේ විමසිලිමත්බව නිසා අනුරාධපුරයේ සැරිසරන චරපුරුෂයන් ද, වෙනත් සැක සහිත පුද්ගලයන් ද පලා යන්නට පටන්ගෙන ඇතැයි ප්‍රචාරයට පත් කළේ ය. ඒ අතර සිරිනාග ගිරිල, මහෙළ බලකොටුවල ද, විජිතපුර බලකොටුවල ද ගොස් ඒවායේ ආරක්ෂක කටයුතු ගැන කරුණු රැස් කළේ ය. තමන් අනුරාධපුර රාජධානියේ තනතුරු දරමින් වැටුප් ලබමින් මාගම රාජ්‍යයට සේවය කිරීම සාධාරණදැයි තමාගෙන් ම ප්‍රශ්න කළ අවස්ථා විය. එහෙත් රට ජාතිය ආගම පරසතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ සටන වඩාත් උදාර යැයි සිතට නගා ගත්තේ ය. මේ අතර ජයනාථ සිටුතුමා අමුත්තකු සමග ආලින්දයට පිවිසෙනු දුටු සිරිනාග මුහුණ සඟවාගෙන නිවස තුළට ගියේ මහත් බියකිනි. සිටුතුමාට ද වෙනස දැනුණි. මද වේලාවක් මහනෙල සමග කතා කරමින් සිටි සිටුතුමා නිවස තුළට ගියේ සිරිනාගගෙන් කරුණු විමසා දැන ගන්නට ය.

"මහ සිටුතුමනි, මේ පැමිණ සිටින්නේ මහනෙල සෙනෙවිතුමා යි. ඔහු දුටුගැමුණු රජතුමාට ඉතාමත් හිතවත්. ඔහු මා හඳුනාගතහොත් ඒ මොහොතේදී ම මා මරා දමන බවට කිසිම සැකයක් නැහැ.'

"මහාසිව මාහිමියන්ගේ උපදෙස් පරිදි මාගම ආරක්ෂක සේනා අතර ප්‍රචාරය කර ඇත්තේ මා චරපුරුෂයකු බව දැනගත් විගස පලාගිය බවයි. නමුත් සත්‍යය දන්නේ නන්දිමිත්‍ර, සුරනිමල මහා සෙනෙවිවරුන් දෙදෙනා පමණයි."

"ඇත්තද? එහෙනම් අප දැන් කුමක් කළ යුතුද? ඔබට වෙනත් නමකින් ඔහු හමුවන්නට බැරිද?"

"ඔව් එහෙම කරමු. මිත්‍ර සෙනෙවියාගේ පුතකු ලෙස මම ඔහු සමග කතා කරන්නම්. සිරිනාග සෙනෙවි තවම රජ මාළිගයේ සිට පැමිණ නැති බව කියන්න."

"හොඳයි, එහෙනම් ඔබ සූදානම් වී පැමිණෙන තුරු මම මහෙනෙල සමග කතා කරමින් සිටින්නම්."

පලතුරු යුෂ පානය සඳහා ආරාධනා කරන බව සේවකයකු පැමිණ පැවසූයෙන් දෙදෙනා මැද සාලයට පිවිසියහ. මේ අතර සිරිනාග පැමිණියේ ය.

මහනෙල ඔහු දෙස බලා විමතිය පළ කරත්ම සිටුතුමා කතා කළේ ය.

"මේ මිත්‍ර මහා සෙනෙවිගේ පුත් සුජීව. සිරිනාගගෙන් කඩු ශිල්පය ඉගෙන ගැනීමට මෙහි පැමිණ සිටිනවා. සිරිනාග සෙනෙවිතුමා තවමත් රාජමාළිගයේ සාකච්ඡාවක නිසා එන්නට ප්‍රමාද වේවිලු."

"මිත්‍ර සෙනෙවිගේ මුහුණුවර එහෙම ම තියෙනවා. මොහු මාගම රාජධානියේ චරපුරුෂ සේවයේ සිට පලා ආ සිවනාග වගේමයි."

"ඔබ සේවය කරන්නේ එළාර රජුට ද?"

" නැහැ. මම කවදාවත් එළාර රජුට සේවය කරන්නේ නැහැ. යුද්ධ ශිල්පය හැදෑරුවත් එළාර රජුගේ සේනාංකයට ඇතුළු වෙන්නේ නැහැ. අවස්ථාවක් ලැබුණු විගස තරුණයන් දෙතුන් සියයක් සමග දුටුගැමුණු සේනාංකයට බැඳෙනවා."

"එහෙනම් ඔබ අපට ප්‍රයෝජනවත් වේවි."

"මම ගැමුණු සේනාංකයේ මහනෙල සෙනෙවි. වෙළඳ කටයුතු සඳහා මාස දෙකකට වරක් අනුරාධපුරයට එනවා. වැඩිපුරම වෙළඳ භාණ්ඩ හුවමාරු කරගන්නේ මේ මහා සිටුතුමා සමගයි. මෙවර කුණ්ඩල බ්‍රාහ්මණතුමාත් හමු වී වෙළඳ කටයුතු ගැන කතා කිරීමට කැමතියි."

"මහනෙල සෙනෙවිතුමනි, මට ඕනෑම කෙනකු සමග කඩු හරඹයෙන් ජයග්‍රහණය කරන්නට පුළුවන්. චතුරංග සේනාවේ මෙහෙයුම් කරුවකු ලෙස මා පුහුණුවක් ලබා තියෙනවා. අශ්ව ධාවනය මගේ ප්‍රියතම ක්‍රීඩාවයි."

"සුජීව, මාගම යුද්ධ ආරම්භයේදී ඔබ අපත් සමග සිටිනවා නම් මම ඉතාමත් කැමතියි."

අයන්ති විතාන

# ආදර්ශය මුහුණ බලන කැඩපතක් වගෙයි

**වර්තමාන සමාජයේ ජීවත්වන ඇතැම් පිරිසකට ආගම, සාහිත්‍ය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැති බව ඇතැම් විට දක්නට ලැබෙන කරුණකි. වාණිජ ලෝකය තුළ කාමය උද්දීපනය වන සමාජ පරිසරයක ජීවත්වන බැවින් යුග ජීවිතය යනු හුදෙක් ලිංගිකත්වය පමණක් බවම ඇතැම් අඹුසැමියන් විශ්වාස කරන බව ද පෙනේ.**
**සම්පත් පරිහරණය කරමින් සතුටින් සැහැල්ලුවෙන් ජීවත්විය යුතු බවට බුදු දහම අවධාරණය කර ඇත. එසේ වුව ද, බුදු දහමට අනුව අධර්ම රාගය ප්‍රතික්ෂේප කර ඇත. නිවැරැදි සමාජ පරිසරයක් ගොඩනඟා ගැනීමට නම්, ධර්මානුකූල ව සිතා ජීවත්විය යුතු ය.**



විවාහයේදී ස්වාමිපුරුෂයාත් ,බිරිඳත් අතර විශාල වයස් පරතරයක් නොතිබිය යුතු ය. එසේ වූ විට ඒ පවුල් ජීවිතයේ සාර්ථකත්වයට විශාල බලපෑමක් ඇතිකරනු ඇත. එම නිසා සෑම පුද්ගලයකු ම තම වයසට ගැලපෙන සේ කටයුතු කළ යුතු ය. රූපවත් නොවේ නම්, ධනවත් නොවේ නම්, සිල්වත් නොවේ නම්, අලස වේ නම්, දරුවන් නැති නම් එම ජීවිතය බොහෝ දුක්මුසු ය.

විවාහයෙන් පසු දරුවන් නොලැබුණහොත් එය අඹුසැමියන්ගේ නොසතුටට හේතු වේ. පෙර ආත්මයක දී සිදුකළ අකුසල කර්මයක් නිසා හෝ ජීව විද්‍යාත්මක සාධක ද පදනම් කරගෙන දරුවන් අහිමි විය හැකි ය.

මෙවැනි අවස්ථාවක දී අඹුසැමියන්ට දරුවන් නීත්‍යානුකූල ව දරුකමට හදාගත හැකි ය. අඹුසැමියන් එම දරුවනට පියකු මෙන්, මවක මෙන් සලකන්නේ නම්, එතැනදී මව් පිය සෙනෙහසක් උපදී.

ආදර්ශය යනු මුහුණ බලන කැඩපතක් බඳු ය. විවාහ ජීවිතය සමබර වීමටත්, ඒ තුළින් ගොඩනැගෙන දරුවන්ට නිසි මග කියාදීමට ත් මව්පියන් කැඩපතක් ලෙස කටයුතු කළ යුතු ය. ඔවුන් සමගියෙන්, ධාර්මික ව, සුචරිතවත් ලෙස පවුල් ජීවිතය ගත කරන විට එම ආදර්ශය දරුවන් ද ලබා ගනී.

ඒ තුළින් ගොඩනැගෙන සමාජය රටට හිතකර ය. සමබර ධාර්මික පවුල් ජීවිතය යනු රටක අනාගත සමාජය වෙනුවෙන් කරනු ලබන ධාර්මික ආයෝජනයක් ලෙස හඳුන්වා දිය හැකි ය. පව් කිරීමට ඇති බිය වළකන ලෝක පාලක ධර්ම බිඳවැටීමට ලක්වුවහොත් පවුල් ජීවිතය අර්බුදයට ලක්වේ.

තමාගේ තරම, හැකියාව, නොදැන කටයුතු කිරීමෙන් හා තීරණ ගැනීමෙන් වර්තමානය වන විට විවාහය කල්දමන ස්වභාවයක් පවතී. යහපත් තරුණයකු හෝ යහපත් තරුණියක ලැබෙන තුරු විවාහය කල්දමන බව ප්‍රකාශ කරයි. විශ්වාසවන්ත තරුණියක හා විශ්වාසවන්ත පිරිමියකු සොයා ගැනීම ද පහසු නොවේ. පවුල් ජීවිතයක් සාර්ථක වීමට නම්, සැමවිටම සැමියාගේ සිතිවිලිත්, බිරිඳගේ සිතිවිලිත් අතර සමබරතාවයක් තිබිය යුතු ය. විශ්වාසවන්ත තරුණයකු හෝ විශ්වාසවන්ත තරුණියක සොයා ගැනීම එතරම් පහසු කාර්යයක් නොවන බව දෙපාර්ශ්වයේ ම අදහස ය. දෙපැත්තටම පොදු වූ ධර්මතාව නම්, එකිනෙකාට එකිනෙකා පිළිබඳ විශාල සැකයක් පැවතීම ය. සාර්ථක පවුල් ජීවිතයකට එය විශාල බාධාවක් වේ.

විශ්වාසය නැතිව ගිය විට සැමියා අන් කාන්තාවන් කෙරෙහිත්, බිරිඳ අන් පුරුෂයන් කෙරෙහිත් බැඳිය හැකි ය.

අප ලෝක සම්මතයන්ට ගරු කළ යුතු ය. එසේ ලෝක සම්මතයන්ට ගරු කරමින් ජීවත් වූ විට සමාජයේ ඇතිවන ගැටුම් බොහෝ දුරට අවම කරගත හැකි ය. වර්තමාන සමාජයේ ඇතැම් මිනිසුන් විසින් තමන්ගේ ලස්සන ජීවිතය අසුන්දර ව අපිළිවෙළ කරගෙන අපාය බවට පත්කර ගනු ලබන්නේ තම චර්යාවන් පාලනය කරගත නොහැකි නිසයි.

එබැවින් නිතරම සමාජය තුළ සාධාරණ ව ජීවත්වෙමින් සමාජ සංස්කෘතියේ පැවැත්මට කටයුතු කළ යුතු ය. යමෙකුට ඉන්ද්‍රිය සංවරය සම්පූර්ණයෙන් ඉෂ්ට කළ හැකි නම්, දුකෙන් මිදීමට හැකි ය. ඉන්ද්‍රිය සංවරය ඇතිකර නොගත හොත් මිනිසුන් පවා තිරිසන් බවට වැටෙන්නේ ය.

යම් දෙයක් සිදුකිරීමේ දී එය තමන්ටත්, අනුන්ටත් අයහපත පිණිස සිදුවෙනවා නම්, එය අකුසලයක් බවට කල්පනා කළ යුතු ය.

එබැවින් යමකුට ඔහුගේ සිතැඟි පරිදි රුචි අරුචිකම් අනුව පමණක් හැසිරීමට අයිතියක් නැත. තමාගේ ක්‍රියාවක් හේතු කොටගෙන සමාජයට යහපතක් හෝ අයහපතක් සිදුවනවා ද? යන්න කල්පනා කළ යුතු ය. සමාජ සම්මුතීන්ට පිටුපා ක්‍රියා කිරීමට අපට අයිතියක් නැත.

**හේමමාලා රන්දුනු**

# රටට සෙත් ප්‍රාර්ථනා කරමින් රතන සූත්‍ර දේශනාවක් හිඟුරාන උත්තර ජය මහා විහාරයේ දී



ගෝලීය වසංගතයක් බවට පත් වී ඇති කොවි 19 වසංගත තත්වය හේතුවෙන් පීඩාවට පත්ව සිටින රට වැසියන්ට ඉක්මන් සුවය සහ ශ්‍රී ලංකා රජය, සෞඛ්‍ය අංශ හා ත්‍රිවිධ හමුදාව වසංගතය තුරන් කිරීමට ගෙන යන වැඩ පිළිවෙළ සාර්ථක ව සිදු කිරීමට ආශිර්වාද ප්‍රාර්ථනා කරමින් හිඟුරාන උත්තර ජයමහා විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම නායක හිමියන්ගේ අවවාද අනුශාසනා මත පසුගිය නිකිණි පොහෝදා සිට දින 07ක් විශේෂ බෝධිපූජාව සහිත රතන සූත්‍ර දේශනාව සිදු කිරීම ආරම්භ කෙරිණි. මෙම විශේෂ බෝධි පූජාව සහිත රතන සූත්‍ර දේශනාව සෑම දිනකම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් සීමිත පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට හිඟුරාණේ සිරිධම්ම නායක හිමියන් කටයුතු යොදා තිබුණි. මේ සඳහා හිඟුරාන උත්තර ජයමහා විහාරස්ථ අම්/සිරිධම්මරතන මහ පිරිවෙනේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ වැඩමවීමෙන් මෙම පින්කම් මාලාව සිදු කෙරිණි.

දමන සමූහ
**කේ.ඒ.මෛත්‍රීපාල**



# බෙල්ලන්විල සඟ පරපුරේ මූලස්ථානය වූ
# අත්තිඩිය මාලිගාවත්තේ පුරාණ විහාරය

පෘතුගීසි ආදී යුරෝපීයයන්ගේ ආක්‍රමණ හමුවේ වනගත ව ගිය බෙල්ලන්විල රජමහා විහාරස්ථානය සහ තදනුබද්ධ දෙතිස්ඵල බෝධිරාජයාණන් වහන්සේ නැවත සොයා ගනිමින් පුනර්ජීවනය සලසන ලද්දේ අත්තිඩියේ මාලිගාවත්තේ පුරාණ විහාරස්ථානය කේන්ද්‍ර කොට ගනිමිනි.



බෙල්ලන්විල විමලරතන අනු නාහිමි



විහාරාධිපති බෙල්ලන්විල ධම්මරතන නාහිමි

සයවැනි පැරකුම්බා මහ රජතුමා අලකේශ්වර ප්‍රභූ රාජයාට විරුද්ධව සටන් කිරීමට පෙර පැපිලියානට සමීප ගමක ගල්තලාවක් මත මාලිගාවක් තනවා කෙටි කලක් විසූ බව ජනප්‍රවාදයේ එයි.

රජුගේ පුණ්‍ය ශක්තිය නිසා ගල් තලාව මත රාජකීය මංගල හස්ති රාජයාගේ පා සටහනක් පිහිටි බවත් ඇත් අඩිය සහිත වූ ග්‍රාමය අත්තිඩිය වී යැයි සැලකේ. රජමාලිගාව පිහිටි බිමට මාලිගාවත්ත නමින් ව්‍යවහාර විය. රජුගේ මන්ත්‍රීවරුන් විසූ කොටස මන්ත්‍රීමුල්ල ලෙස ව්‍යවහාර කොට ඇත.

බෙල්ලන්විලට දකුණින් පිහිටි අත්තිඩිය ග්‍රාමයේ විචිත්‍රත්වය කෝට්ටේ යුගයේ රචිත පරෙවි, ගිරා සහ කෝකිල සන්දේශයන්හි විස්තර කෙරෙයි. පරෙවි, කෝකිල සන්දේශයන් අත්තිඩියේ කාන්තාවන්ගේ රූප ශෝභාව සහ විචිත්‍රවත් ගීත ගායනය අගය කොට ඇත. ගිරා සන්දේශයට අනුව මේ ප්‍රදේශයේ වාසය කළ රාජකීය යුද්ධ හමුදාවේ සේවය කළ සොල්දාදුවන්ගේ ස්වාමි දියණිවරුන් තම සැමියන් ලද වැටුපෙන් සතුටු වී මිහිරි හඬින් ගීත ගායනා කොට තිබේ.

ආක්‍රමණ හමුවේ මෙම නටබුන් විනාශයට පත් වූ පසු 19 වන සියවස මුල්භාගයේ දී සන්දේශ කාව්‍යගත තොරතුරු අනුව අත්තිඩිය සොයා පැමිණි තෙන්ගොඩගෙදර හිමියන් විසින් මාලිගාවත්තෙහි ගල් තලාව මත ආවාස ගෙයක් තනා ගනිමින් මෙහි විහාරස්ථානයක් ආරම්භ කරන ලදි. ගල් තලාව මත තැන වූ විහාරය යන අරුතින් අත්තිඩියේ ගලඋඩ පන්සල නමින් ව්‍යවහාර විය.

වර්ෂ 1850දී පමණ අත්තිඩියේ කටු ඇළ ඔස්සේ තොටියකු සමඟ ඔරුවකින් ගමන් කළ තෙන්ගොඩගෙදර හිමියන්ට වනය මැදින් බෙර හඬක් ඇසුණු බවත්, ඒ පිළිබඳ කරුණු සොයා යාමේදී බෙර හඬ මැකී ගොස් වනස්පතීන් අතර මැනවින් ආරක්ෂා වී තිබුණු බෙල්ලන්විල දෙතිස්ඵල බෝධි රාජයාණන් වහන්සේ හඳුනා ගත් බවත් ජනප්‍රවාදගත ව එයි.

මින් පසු බෙල්ලන්විල බෝධිසමීපාරාමය නමින් විහාරස්ථානයේ පුනර්ජීවන කටයුතු ආරම්භ කරන ලද්දේ තෙන්ගොඩගෙදර හිමියන්ගේ මූලිකත්වයෙනි.

මෙතැන් සිට අද දක්වා බෙල්ලන්විල සහ මාලිගාවත්තේ විහාරද්වය සඳහා එකම අධිපති ස්වාමින්ද්‍රයන් වහන්සේ නමක් පත් වෙති. මෙම සම්ප්‍රදාය වෙනස් වී ඇත්තේ මාලිගාවත්ත සඳහා දුම්බර වේඬරුවේ උපනන්ද හිමියන් අධිපතිත්වය දැරූ අවස්ථාවේදී පමණි.

තෙන්ගොඩගෙදර හිමියන්ගෙන් පසු තත්ශිෂ්‍ය ගණාචාර්ය උඩුගම්පොල රතනපාල මහා ස්වාමින්ද්‍රයන් වහන්සේ විහාරාධිපතීත්වයට පත් වූහ. රත්මලානේ පරමධම්මචේතිය පිරුවනේ වලානේ සිද්ධාර්ථ මාහිමියන්ගේ ජ්‍යෙෂ්ඨතම ශිෂ්‍ය හිමිනමක වශයෙන් පිරුවනෙහි උපාචාර්යයන් වහන්සේ වශයෙන් කටයුතු කළ උඩුගම්පොල රතනපාල මාහිමිපාණන් වහන්සේ ලක්දිව සාතිශය සම්භාවනීය උගතෙකු වශයෙන් සම්භාවනා ලැබූහ.

සියම් නිකායේ පහතරට උපසම්පදා පිහිටුවීම, අධිමාසවාදය, පාරුපනවාදය වැනි වැදගත් ශාසනික කටයුතුවල මුඛ්‍ය කාර්යභාරයක් උසුලන ලදි. වර්ෂ 1856 ශ්‍රී කල්‍යාණී සාමාග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ආරම්භක කර්මවාගාචාර්යයන් වහන්සේ නමක ලෙස ද කටයුතු කළ අතර 1867 පැල්මඬුල්ල ත්‍රිපිටක සංගායනාව සඳහා සියම් නිකාය වෙනුවෙන් දායකත්වය ලබා දී 1888 වසරේ අපවත් වී වදාළහ.

උඩුගම්පොල රතනපාල මාහිමියන්ගෙන් පසු පිළිවෙළින් වේඬරුවේ උපනන්ද හිමියන් සහ බෙල්ලන්විල විහාරාධිපති උඩුගම්පොල ධම්මක්ඛන්ධ මාහිමියන් මාලිගාවත්තේ විහාරාධිපතීත්වය හෙබවූහ.

වර්ෂ 1894 දී කැලණි ගඟ ආශ්‍රිතව සිදු කළ උපසම්පදා කටයුතු කෝට්ටේ රජමහා විහාරයට රැගෙන යාමට තීරණය කළ අවස්ථාවේ ඊට විරෝධය පළ කරමින් මුල්ලේරියාව ගල්වාන විහාරය ආශ්‍රිතව උපසම්පදා කටයුතු සිදු කිරීමට ධම්මක්ඛන්ධ හිමියන් එක්ව පසුව මල්වතු විහාරයට සම්බන්ධ වී නැවත කෝට්ටේ රජමහා විහාරය ආශ්‍රිත උපසම්පදා සඳහා දායකත්වය ලබා දුනි.

අභිධම්මිකාචාර්ය වෑබඩ සංඝරතන මාහිමිපාණන් වහන්සේ ධම්මක්ඛන්ධ මාහිමියන්ට පසු අත්තිඩිය සහ බෙල්ලන්විල විහාරද්වයේ විහාරාධිපති පදවිය හෙබවූහ. ලක්දිව වැඩ සිටි අසහාය අභිධර්ම උගතෙකු වශයෙන් පරමාර්ථ විකාශනී නම් ග්‍රන්ථය රචනා කරමින් ද දිවයිනේ චිරප්‍රසිද්ධ ධර්ම දේශක හිමිනමක වශයෙන් ද නාහිමිපාණන් වහන්සේ කීර්තියට පත් වූහ. ඉනික්බිති කෙටි කලක් අස්ගිරියේ දේවරක්ඛිත හිමියන් විහාරාධිපති ව වැඩ සිටියහ.

වෑබඩ නාහිමියන් වැඩසිටින අවධියේ සිට මාලිගාවත්තේ විහාරයේ නිත්‍යවාසීව වැඩසිටි බෙල්ලන්විල සෝමරතන නාහිමිපාණන් වහන්සේ වර්ෂ 1946 වර්ෂයේ දී මාලිගාවත්තේ සහ බෙල්ලන්විල විහාරාධිපති පදවියට පත් වීම විහාරද්වයේ ම ඉතිහාසයේ නව මං සලකුණු කිරීමක් විය. බෙල්ලන්විල රජමහා විහාරය දේශ දේශාන්තරයේ ප්‍රකට වන අන්දමින් විහාර කර්මාන්ත කරවා පෙරහර ඇතුළු සංස්කෘතික කටයුතු අරඹන ලද්දේ සෝමරතන නාහිමිපාණන් වහන්සේ විසිනි. මාලිගාවත්තේ විහාරයේ විහාර මන්දිරය ඇතුළු විහාර කර්මාන්ත සෝමරතන නාහිමිපාණන් වහන්සේ විසින් අද පවතින අන්දමට දියුණු කරවන ලදි.

කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්මමහා සංඝ සභාවේ රත්මලාන විහාර පාර්ශ්වයේ ප්‍රධාන සංඝ නායක පදවියෙන් 1966 වසරේ පුද ලද බෙල්ලන්විල සෝමරතන නාහිමිපාණන් වහන්සේ 1984 වර්ෂයේ අපවත් වූ පසු සිංගප්පූරුවේ ප්‍රධාන සංඝ නායක, ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ වෙත විහාරාධිපති ධුරයේ වගකීම් පැවරුණි. නාහිමිපාණන් වහන්සේ ජාත්‍යන්තර ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරතව සිටි බැවින් විහාරස්ථානයන්හි සියලු කටයුතු සඳහා බෙල්ලන්විල හා අත්තිඩිය උභය විහාරාධිකාරී, කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්මමහා සංඝ සභාවේ අනුනායක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති, අපවත් වී වදාළ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනාහිමිපාණන් වහන්සේ නායකත්වය සැපයූහ.

අතිගරු නායක මාහිමිපාණන් වහන්සේලාගේ අනුශාසනා මත කලින් කල සූරියගොඩ ධම්මික හිමි, පණ්ඩිත හිරිපිටියේ පඤ්ඤකිත්ති හිමි ආදී යතින්ද්‍රයන් වහන්සේලා විහාරස්ථානයේ දියුණුවට කැප වූ අතර වර්තමානයේ කැම්පනේ ඉන්දරතන මාහිමියන් ඇතුළු විහාරවාසී මහා සංඝ රත්නයේ අනුශාසනා පරිදි මාලිගාවත්ත පුරාණ විහාරයේ කටයුතු සිදු කෙරෙයි.

සිරිලක සම්බුද්ධ ශාසනෝද්දීපනිය උදෙසා සුවිශාල දායකත්වයක් සපයන ලද බෙල්ලන්විල සඟ පරපුරෙහි මූලස්ථානය වශයෙන් සම්භාවනාවට පත් වන අත්තිඩිය මාලිගාවත්තේ පුරාණ විහාරය සුවිශේෂී පුදබිමක් වශයෙන් සඳහන් කළ හැකිය.

දිමුතු පුන්සර කොළඹගේ

